

# 2024

# ප්‍රගති වාර්තාව

# முன்னேற்ற அறிக்கை

# Progress Report


වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு, மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு

Ministry of Trade, Commerce, Food Security and Co-operative Development

# 2024 - ප්‍රගති වාර්තාව

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන
අමාත්‍යාංශය

**නවීන ජීවිතයක්, පොහොසත් රටක්...**



සුවහසක් ජනයාගේ බලාපොරොත්තු ඉටු කිරීමේ මාර්ග සිතියම වූ "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" අප රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කිරීමේදී වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා හැටියට මෙහිදී පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සතුට දනවන්නකි.

රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම මෙන්ම පාරිභෝගිකයාට ආරක්ෂිත ආහාර සැපයීමත් මාගේ අමාත්‍යාංශයේ වගකීම වේ. මෑතකදී රට තුළ ඇතිවූ සහල් අර්බුධය, පොල් හිඟය සහ ලූණු තොග ප්‍රමාණවත් නොවීම තුළ පාරිභෝගිකයාට යම් දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදු විය. පසුගිය වකවානුවේ පැවැති පාලනයන් නිවැරදි දත්ත මත පදනම්ව වෙළෙඳපොළ නියාමනයන් සිදු නොකිරීම හේතුවෙන් අප රජය බලයට පත් වී මසක් ඉකුත්වීමටත් ප්‍රථම සහල් සැපයුම අඩාල විය. එහෙත්, මාගේ අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වන ලංකා සතොස සහ සී/ස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා සහල් ආනයනය කොට වෙළෙඳපොලේ පැවැති ව්‍යාකූලත්වය කළමනාකරණය කර ගැනීමටත් සමත් විය.

රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට නම් රජය සතුව ආරක්ෂිත තොග පැවැතීම අත්‍යාවශ්‍යය. එසේ නොවුණහොත්, දැනට සිදු වන අන්දමට මහා පරිමාණ වෙළෙන්දන් කිහිපදෙනෙකු පාරිභෝගිකයා ග්‍රහණයට ගනු ඇත. 2025 වසරේ මහ කන්නයේ පටන්, ආරක්ෂිත වී තොගයක් පවත්වා ගැනීමට අප අමාත්‍යාංශය සහ වී අලෙවි මණ්ඩලය තීරණය කරන්නේ ඒ නිසාය.

රටේ වගා කළ හැකි කෘෂි භෝග සියල්ල වගා කිරීම අප රජයේ ප්‍රතිපත්තියයි. වාර්ෂිකව ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා දළ වශයෙන් ඩොලර් මිලියන 1,600ක් පමණ වැය වේ. ඉදිරි වසර තුළ මින් 40% - 50% ත් අතර ප්‍රමාණයක් ඉතිරි කර ගැනීම අපගේ බලාපොරොත්තුවයි. ඒ සඳහා 2025 වසරේ ආරම්භ කෙරෙන නිෂ්පාදන සමූපකාර 1000 වැඩසටහන ප්‍රධාන වශයෙන් දායක වනු ඇත. මාගේ අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාණිජ දෙපාර්තමේන්තුව හරහා අගය එකතු කළ නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළට එක් කිරීමට අවශ්‍ය වැඩසටහන් සකස් වෙමින් ඇත. ලංකා සතොස අලෙවි ජාලය පුළුල් කිරීමට අමතරව, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව නැවත සක්‍රීය කොට තොග වෙළෙඳ මධ්‍යස්ථාන කිහිපයක් තෝරා ගත් දිස්ත්‍රික්ක වල ඇති කිරීමට කටයුතු කෙරෙනු ඇත. පාරිභෝගික සේවා අධිකාරිය ශක්තිමත් කොට, ගුණාත්මක භාණ්ඩ වෙළෙඳපොළ තුළ සංසරණය වීම විධිමත් කිරීමට අවශ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කරමින් සිටී. නවීන තාක්ෂණය හඳුන්වා දෙමින්, දූෂණ අක්‍රමිකතා පිටු දැක රටේ ජනයාට පොරොන්දු වූ පුනරුද යුගය බිහිකිරීම උදෙසා රජයක් හැටියට අප කටයුතු කරමින් සිටිමු. නවීන ලෝකයක , සැම අතින්ම පොහොසත් රටක නවීන ජීවිතයක් ඔබට ලබා දීමට අප ගන්නා වූ මේ උත්සාහයට සැමගේ දායකත්වය ලැබෙනු ඇතැයි මා විශ්වාස කරමි.

**වසන්ත සමරසිංහ (පා.ම.)**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍ය

**අභිමානවත් ජාතියක් ලොව දිනන හෙටක්...**



රටක් දියුණුව කරා ගෙන යන්නට බලපාන ප්‍රමුඛතම කරුණ වන්නේ එහි දේශපාලන ව්‍යුහය මඟින් ගොඩ නගනු ලබන මෙහෙයුම් යාන්ත්‍රණයයි.

2024 නොවැම්බර් මස 22 දින අප විසින් රට භාර ගන්නා මෙහොත වන විට රටේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව පැවතියේ උග්‍ර අර්බුදයකි. රටේ ජනයාගේ සෞඛ්‍ය, ආර්ථිකය, අධ්‍යාපනය යන මේ සියල්ල එකිනෙකට බද්ධ වූ ගතික ක්‍රියාවලීන් වන අතර ඒ සියල්ල අඩාල වී ගොස් තිබුණේ බරපතල තැනකටය. අමාත්‍යාංශයක් ලෙස ඉතා කෙටි කලක් තුළ අංශයට අදාළ ගැටලු හඳුනා ගනිමින් නිවැරදි තිරසාර විසඳුම් ලබා දෙන්නට ඇවැසි මාර්ග අනාවරණය කර ගනිමින් රටේ සෞභාග්‍ය උදා කිරීමට හැකි වන ක්‍රියාදාමය සැලසුම්කරණය සඳහා සමූහගතව සාර්ථක ගමනක් ආරම්භ කළ බව සතුටින් සඳහන් කරමි.

මහජනයාගේ ආහාර වේල පත්ව ඇති අනාරක්ෂිත බවෙන් මුදවා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලැබෙන්නට සලස්වන්නට කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන සැලසුම් තුළ සිට ක්‍රියා කිරීමට අමාත්‍යාංශයක් ලෙස අප දැඩි අදිටනින් හා ඉතා විශ්වාසයෙන් පියවර තබා ඇත්තෙමු.

අනාගත ආහාර සුරක්ෂිතතාව තහවුරු කරනු වස් නිරන්තර බත සපයන ක්‍රමය සැලසුම් කරන්නට රටේ ධනය යට කොට ඉදි කළ වැසී තිබුණු වී ගබඩා හා මෝල් නැවත පිළිසකර කොට සක්‍රීය කර ගොවි දැතින් නිපැදවෙන වී සුරක්ෂිතව ගබඩා කරන්නට සූදානම් කිරීම සිදු කරන ලදී.

සතොස, සමූපකාර, වෙළෙඳ මධ්‍යස්ථාන, වී අලෙවි මණ්ඩලය හා පුද්ගලික ආයතන හරහා සමස්ත රටේම වෙළෙඳාම හා බැඳුණු ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරන්නට සැලසුම් සම්පාදනය හා ඉහළ කළමනාකරණය ඊට දායක කොට රට පුරා ආහාර සුරක්ෂිත කළමනාකරණයක් සැලසුම් කරමින් සිටිමු. දිගු කලක් තිස්සේ ඇති වූ සියලු අංශයන්ගේ අක්‍රමවත් බව මඟින් ඇති වී තිබෙන දැවැන්ත අර්බුදය විසඳන්නට අනෙකුත් අමාත්‍යාංශ සමඟ එක්ව අප අමාත්‍යාංශය යෝධ ශක්තියක් වන්නට සූදානම්ව සිටිමු.

ජන ජීවිතයේ සියලු කටයුතු වෙළෙඳ, වාණිජ යන අංශ සමඟ තදින් බැඳී ඇති අතර සමූපකාරය ඒ හා එක් කොට මහජන ආර්ථිකය ගොඩ නගන පැහැදිලි දැක්මක් ක්‍රියාවට නඟන්නට ඉතා කෙටි කළක් තුළ ගත් ක්‍රියාමාර්ග පැහැදිලිවම උපකාරී වනු ඇත.

සම්ප්‍රදායික අපනයනයන් වෙනුවට ඒවා නවීකරණය කිරීමටත්, සැඟවුණු එහෙත් විශාල විදේශ විනිමයක් ඉපැයිය හැකි නිෂ්පාදන හා සේවා අනාවරණයටත් ප්‍රවර්ධනයටත් කටයුතු සැලසුම් කරමින් සිටිමු. ශ්‍රී ලංකා පොළෝතලයේ පැළවෙන හැම පැළයක්ම ආර්ථික සම්පතක් බවට පත් කළ හැකි මිනිසුන් සිටින රටක් බව හඳුනා ගනිමින් නව නිෂ්පාදන කෙරෙහි රට යොමු කිරීමට සැලසුම් සකස් කරමින් සිටිමු. ආනයන හා අපනයනයට බලපාන රෙගුලාසි අණපනත් අවශ්‍ය පරිදි නවීකරණය කරමින් අපනයනකරුවන් හා නිෂ්පාදකයින් දිරි ගැන්වීමේ ක්‍රියාමාර්ග ගනිමින් අනාගත විදේශ වෙළෙඳපොළ ජය ගන්නට සැලසුම් සකසා ඇති බව සතුටින් දක්වමි.

සතුට සාමය සපිරි ජයග්‍රාහී මිනිසුන් ලෙසත්, අභිමානවත් ජාතියක් ලෙසත්, ලෝකය දිනන්නට නොකැඩෙන අත්වැලක් වන්නට ආණ්ඩුවක් ලෙස සියලු තල සවිබල ගන්වන්නෙමු.

මාගේ මවුබිමටත් ලාංකීය ජාතියටත් සෞභාග්‍යමත් යුගයකට සුබපැතුම්...

**ආර්.එම්.ජයවර්ධන (පා.ම.)**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍ය

**ආහාර සුරක්ෂිත රටක්, ලස්සන ජීවිතයක්...**



ආහාර සුරක්ෂිත රටක් ගොඩනැගීමේදී සමුපකාර නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට මෙහිදී මාගේ සුභ පැතුම් එක් කිරීමට කැමැත්තෙමි. ලංකාව කෘෂි කාර්මික රටක් වුවද, බොහෝ ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වාර්ෂිකව විශාල විදේශ විනිමයක් වැය කිරීමට සිදුව ඇත. විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දීමත් සමඟ දේශීය ගොවියා වගාවෙන් ඈත් වීමත්, ග්‍රාමීය ආර්ථිකයට විශාල දායකත්වයක් සැපයූ සමුපකාර ව්‍යාපාරය කඩා වැටීමත් තුළ රටේ දරිද්‍රතාවය ඉහළ ගොස් අද වන විට මිලියන 22ක් වූ ජනගහනයෙන් 26%කට ආසන්න පිරිසක් දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වේ. එවන් වටපිටාවක් තුළ සමුපකාරය නැවත ගොඩ නැගීමත්, රටේ කෘෂි නිෂ්පාදන වැඩි දියුණු කරමින් නව තාක්ෂණය ගොවිබිමට කැඳවීමටත් අපගේ නව රජය කටයුතු කරමින් සිටී.

2025 වසරින් ආරම්භ වන දීප ව්‍යාප්ත නිෂ්පාදන සමුපකාර වැඩ සටහන හරහා මුල් වටයේදී තෝරා ගත් කෘෂි භෝග 10ක් සහ සුළු අපනයන භෝග 05ක් කේන්ද්‍ර කරගෙන නිෂ්පාදන සමුපකාර 1000ක් ආරම්භ කිරීමට මේ වන විටත් මූලික කටයුතු ආරම්භ කොට ඇත. මේ හරහා ගොවියා සංවිධානය කොට, නිෂ්පාදන පිරිවැය අවම කරමින්, තම කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා දීම තහවුරු කිරීම අරමුණ කර ගෙන ගොවි සංවිධාන, සමුපකාර සහ තොග ගැනුම්කරුවන් අතර ලිඛිත එකඟතාවයක් ඇති වනු ඇත. නිෂ්පාදන සමුපකාරය හරහා ගොවියාට අවශ්‍ය මූල්‍ය පහසුකම්, බීජ, පොහොර හා තාක්ෂණය සැපයෙන අතර, අදාළ නිෂ්පාදන එකතු කර ගුණාත්මකව ගබඩා කොට ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවය මත සැපයීම සිදු කෙරේ.

රටේ දැනට 30%- 40%ක මට්ටමේ පවතින පසු අස්වනු හානිය පාලනය කිරීමත්, පාරිභෝගිකයාට ආරක්ෂිත ආහාර සැපයීමත් අපගේ රජයේ වගකීමක් වේ. වෙළෙඳපොළ අතරමැදියන් අවම කිරීම තුළ පාරිභෝගිකයාට සාධාරණ මිලකට භාණ්ඩ ලබා ගැනීමට ඇති හැකියාව තහවුරු කළ යුතුය. වෙළෙඳපොළ කතිපයාධිකාරයන් පාලනය කිරීම සඳහා රට තුළ ආරක්ෂිත තොග පවත්වා ගැනීමේ වගකීමක් අප රජයට ඇත. විදේශ රටවලින් කෙරෙන ආනයන ක්‍රමානුකූලව අඩු කර ගැනීමටද අපගේ අපේක්ෂාවයි. මෙමඟින් සැම අතින්ම පොහොසත් රටක් නිර්මාණය කිරීමට යන ගමනේදී, ජාතික ජන බලවේග ප්‍රතිපත්ති ප්‍රකාශයේ අභිමතාර්ථ ඉටු කර ගැනීම මූලික කර ගෙන අපගේ අමාත්‍යාංශයටද ඒ සඳහා දායක වීමට ලැබීම සතුටකි.

ඒ අනුව, "ආහාර සුරක්ෂිත රටක් - ලස්සන ජීවිතයක් " ඇති කිරීම සඳහා අප ගන්නා වූ මෙම උත්සාහයට දායක වීම සඳහා සහෝදර ඔබ සැමට ආරාධනය කරමි.

**උපාලි සමරසිංහ (පා.ම.)**
සමුපකාර නියෝජ්‍ය අමාත්‍ය

**අමාත්‍යාංශ ලේකම්ගෙන්...**



රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් ශ්‍රී ලාංකික ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා උපරිම දායකත්වයක් සැපයීම වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ මූලික කාර්යභාරයයි. ඒ අනුව, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අංශ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සපයමින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ඉහළ දායකත්වයක් ලබා දීම, සේවා හා නියාමන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, මෙන්ම ඒ මඟින් වෙළෙඳ සහ පාරිභෝගික ප්‍රජාව වෙත අවශ්‍ය පහසුකම් සපයමින් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අවශ්‍ය පියවර රැසක් දැනටමත් ගෙන ඇත. වෙළෙඳ හා වාණිජ ක්ෂේත්‍රයන්හි තත්ත්වය ඉහළ නංවමින් දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම මඟින් පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට සාධාරණ හා තරඟකාරී වෙළෙඳපොළ ප්‍රවේශයක් නිර්මාණය කිරීම අපගේ ඉලක්කය වේ.

මෙම ඉලක්කය අරමුණු කර ගනිමින් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන යන ක්ෂේත්‍රවලට අදාළ ආයතන ජාලය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම තුළින් පාරිභෝගිකයාට ගුණාත්මක භාණ්ඩ හා සේවා සාධාරණ මිලකට ලබාදීම සඳහා වන මැදිහත් වීම පසුගිය වසර තුළ ද උපරිම වශයෙන් සිදුකර ඇත. එහෙත් දුපත් ආර්ථිකයක් සහ අහිතකර කාලගුණික විපර්යාසයන්ට ලක් වීමේ අවධානම මෙන්ම ගෝලීය වෙළෙඳපොළ මෙහෙයුම්හි නිරතුරුවම සිදුවන වෙළෙඳපොළ අසමතුලිතතාවයන් හේතුවෙන් ඇති වන භාණ්ඩ හිඟය හා මිල ඉහළ යාම සඳහා තිරසාර විසඳුම් සෙවීමට අවශ්‍යවන අතර ඒ සඳහා නව ක්‍රමෝපායන් අනුගමනය කළ යුතුව ඇත. එබැවින් 2025 වසර නව ඇරඹුමක් සනිටුහන් කරන වසරක් ලෙස හඳුන්වා දීමට හැකිය. එහිදී පස් වසරක් සඳහා වන උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමටත් ඒ අනුව වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර යන අංශ යටතේ වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීමටත් අපේක්ෂා කෙරේ. ආහාර සුරක්ෂිත කිරීමේ අරමුණ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවක් ස්ථාපිත කර ඇති අතර එය සම අමාත්‍යාංශ වන වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා වැඩි දියුණු කර ගැනීම අරමුණු කර ගනිමින් ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන, වෙළෙඳ ප්‍රජාවගේ සහභාගීත්වයෙන් රැස්වීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්, ඒකාබද්ධ කොමිසම් හරහා අපනයන සඳහා නව වෙළෙඳපොළ අවස්ථා පුළුල් කර ගැනීම තුළින් විදේශ විනිමය ඉපයීම වර්ධනය කර ගැනීමේ ක්‍රියාවලිය වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව නව ප්‍රවේශයකින් යුතුව ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. තවද, මෙම අරමුණ සාක්ෂාත් කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අපනයනකරුවන් ලෙස ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමට නියමිතය.

විශේෂයෙන්ම නිෂ්පාදන ඉලක්ක කර ගත් සමූපකාර සමිති 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන ආරම්භ කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා මිනුම්, ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව යන ආයතන කටයුතු ඩිජිටල්කරණය කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත. එමෙන්ම, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සාධාරණ මිලකට ලබාදීම සඳහා පෞද්ගලික අංශය සමඟ තරඟ කළහැකි පරිදි ලක් සතොස හා සමූපකාර වෙළෙඳ ජාලය තවදුරටත් නව්‍යකරණය කිරීමටත් ඍජු ආනයන කටයුතු කළ හැකි සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව හා ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙහි කටයුතු පුළුල් කිරීමටත් සැලසුම් කරමින් පවතී. මෙම සන්දර්භය තුළ, රටේ පවත්නා රජයේ සතු ආහාර ද්‍රව්‍ය සැපයුම් දාමය තහවුරු කිරීම සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම හා නැවත සක්‍රීය කිරීමට කටයුතු සිදු කරනු ඇත.

මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය සාර්ථක කර ගැනීම සඳහා නිරතුරුව උපදෙස් හා මඟපෙන්වීම ලබා දෙන ගරු අමාත්‍යතුමාටත් නියෝජ්‍ය අමාත්‍යවරුන් දෙදෙනාටත් අමාත්‍යාංශයේ මෙහෙවර හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීමෙන් යුතුව කටයුතු කරන අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට හා අනුබද්ධ ආයතන ප්‍රධානීන් ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පිරිනමමි.

**කේ. ඒ. විමලේන්තිරරාජා**
ලේකම්

# පෙළගැස්ම

01. පළමු පරිච්ඡේදය - දැක්ම මෙහෙවර අරමුණු සහ කාර්යයන් ....................1

02. දෙවන පරිච්ඡේදය - සුවිශේෂිතා ....................7

03. තෙවන පරිච්ඡේදය - 2024 - ප්‍රගතිය ....................13

04. සිව්වන පරිච්ඡේදය - 2025 - ඉදිරි සැලසුම් ....................53

## වගු පෙළගැස්ම


වගු අංකය 2. 1 අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත සැපයීම සඳහා පනවන ලද උපරිම සිල්ලර හා තොග මිල ගණන් .......... 9

වගු අංකය 2. 2 සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට පවරා දුන් ගබඩා .......... 11

වගු අංකය 3. 1 මූල්‍ය ප්‍රගතිය .......... 15

වගු අංකය 3. 2 විශේෂ විමර්ශන හා මූලික විමර්ශන .......... 16

වගු අංකය 3. 3 විදේශගතව සිටින වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් .......... 27

වගු අංකය 3. 4 ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සහ අනෙකුත් උපකාරක සේවාවන් .......... 28

වගු අංකය 3. 5 ආදායම් උත්පාදන වැඩසටහන් සහ ව්‍යාපෘති වල ප්‍රගතිය .......... 29

වගු අංකය 3. 6 මෙහෙයුම් ක්‍රියාකාරකම්හි ප්‍රගතිය .......... 30

වගු අංකය 3. 7 2024 ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු .......... 31

වගු අංකය 3. 8 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය පිළිබඳ තොරතුරු .......... 32

වගු අංකය 3. 9 විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්‍ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම 32

වගු අංකය 3. 10 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන ලබා දීම .......... 33

වගු අංකය 3. 11 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2024 වසරේදී ලබා දී ඇති නව ප්‍රතීතනයන් .......... 34

වගු අංකය 3. 12 දේශීයව සිදු කළ කාර්යයන්හි ප්‍රගතිය .......... 36

වගු අංකය 3. 13 පීඩනය හා පරිමාව පිළිබඳ විද්‍යාගාර විසින් ලබා ඇති ප්‍රතීතන යාවත්කාලීන කර පවත්වාගෙන යාම. .......... 38

වගු අංකය 3. 14 ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානයන්හි මූල්‍ය ප්‍රගතිය .......... 39

වගු අංකය 3. 15 ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානවල භාර අරමුදල් මගින් සිදුකළ කාර්යයන්හි ප්‍රගතිය .. 40

වගු අංකය 3. 16 භෞතික ප්‍රගතිය .......... 41

වගු අංකය 3. 17 කාර්මික සැලසුම් .......... 42

වගු අංකය 3. 18 වෙළඳ ලකුණු .......... 42

වගු අංකය 3. 19 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය .......... 43

වගු අංකය 3. 20 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමිති අංශයේ ප්‍රගතිය .......... 45

වගු අංකය 3. 21 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති අංශයේ ප්‍රගතිය .......... 45

වගු අංකය 3. 22 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු අංශයේ ප්‍රගතිය .......... 46

වගු අංකය 3. 23 සමුපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යභාරය සම්බන්ධ ප්‍රගතිය .......... 46

වගු අංකය 3. 24 දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම .......... 47

වගු අංකය 3. 25 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් සිදුකරන ලද කාර්යයන් .......... 48

වගු අංකය 3. 26 සමාගම් වල නාමය අනුමත කිරීම .......... 51

වගු අංකය 3. 27 විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව .......... 51

වගු අංකය 3. 28 ලියාපදිංචි කර ඇති සමිති .......... 52

# පළමු පරිච්ඡේදය

# දැක්ම මෙහෙවර අරමුණු සහ කාර්යයන්

# 01. දැක්ම මෙහෙවර අරමුණු සහ කාර්යයන්

## 1.1. දැක්ම

"තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

## 1.2. මෙහෙවර

වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා සැපයීමේ හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙඳුන් හා වෙනත් සේවා සපයන්නන්ගේ සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා වෙළෙඳ අයිතින් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සබඳතා වැඩිකර ගැනීමට ද්විපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් සඳහා එළඹීම තුළින් නව වෙළෙඳපළ අවස්ථා හිමි කරගැනීමටත්, ශ්‍රී ලාංකිකයින්ගේ එදිනෙදා පාරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ඉහළ ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමටත් දායක වීම.

## 1.3. අරමුණු

i. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරැකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.

ii. වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.

iii. විවෘත තරගකාරී වෙළෙඳපොළ පරිසරයක ලංකා සතොස සමාගම, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික මට්ටමින් සමුපකාර සමිති හා සංගම් වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීම.

iv. වෙළෙඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතින් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම.

v. ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

vi. පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට අදාළ නෛතික කටයුතු සඳහා පාරිභෝගික සේවා අධිකාරියට අවශ්‍ය මඟපෙන්වීම.

vii. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.

viii. දේශීය නිෂ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වීම.

ix. උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම.

x. ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම.

xi. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතීතන සේවා සහතික කිරීමට අදාළ මඟපෙන්වීම.

xii. ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපළ අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම.

xiii. අදාළ ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.

xiv. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය ( GSP ) අන්‍යෝන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් (NMTR), නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් (RTA) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මඟපෙන්වීම.

**1.4. කාර්යයන්**

I. රජය මඟින් ක්‍රියාත්මක කරන ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වෙළෙඳ විෂයට අදාළ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම.

II. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන්, ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

III. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ වන ආයතන සම්බන්ධීකරණය කිරීමට කටයුතු කිරීම.

IV. පාරිභෝගිකයාගේ අයිතීන් සුරැකීම සහ අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීම සඳහා පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා වෙළඳපොළ තරඟකාරීත්වය ඇති කිරීම, වෙළඳපොළ අධීක්ෂණය, වැටලීම් කිරීම හා වෙළඳුන් හා පාරිභෝගිකයින් දැනුවත් කිරීම.

V. දේශීය වෙළෙඳපළ තුළ ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම.

VI. ලෝක වෙළෙඳපොළ තුළ නව අපනයන අවස්ථා හඳුනාගැනීමට මෙන්ම නව ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා පිළිබඳ ගවේශණය කිරීමට ආයතන දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

VII. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම හා ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරන බුද්ධිමය දේපළ පද්ධතියක් ස්ථාපිත කිරීම.

VIII. සමාගම්, ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබාදීම හා ඒවායේ කාර්යන් ක්‍රමවත් කිරීම.

**1.5. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන**

i. වාණිජ දෙපාර්තමේන්තුව
ii. සීමාසහිත ලංකා සතොස සමාගම
iii. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
iv. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
v. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
vi. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
vii. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන
viii. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
ix. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
x. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
xi. සමුපකාර සේවක කොමිෂන් සභාව
xii. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
xiii. සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව
xiv. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
xv. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

# දෙවන පරිච්ඡේදය

# සුවිශේෂිතා

## 02. සුවිශේෂිතා

2.1 අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත සැපයීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම නිරන්තරයෙන් සිදු කළ අතර අසාධාරණ වෙළෙඳ චර්යාවන් (Unfair Trade Practices) පාලනය කිරීම සඳහා භාණ්ඩවල ගුණත්වය පරීක්ෂා කිරීම හා පාරිභෝගිකයාට දැරිය හැකි මිලකට ලබා දීම වෙළෙඳපොළට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව ලබාදීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී උපරිම සිල්ලර මිලක් හා උපරිම තොග මිලක් නියම කිරීම හා අවස්ථානුකූලව එම මිල ගණන් ඉවත් කිරීම මඟින් පාරිභෝගික ජනතාවට සහන බලා දීම සඳහා කටයුතු කරන ලදී. එම උපරිම සිල්ලර/තොග මිල ගණන් පැනවීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

*වගු අංකය 2. 1 අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත සැපයීම සඳහා පනවන ලද උපරිම සිල්ලර හා තොග මිල ගණන්*

| අනු අංකය | අයිතමය | වර්ගීකරණය | ගැසට් අංකය හා දිනය | උපරිම මිල ගණන් පැනවීම | | වෙනත් |
|---|---|---|---|---|---|---|
| | | | | තොග මිල(රු.) | සිල්ලර මිල (රු.) | |
| 1 | සහල් (දේශීය) | කීරි සම්බා | 2414/02 2024.12.09 | 255.00 | 260.00 | |
| | | සම්බා | | 235.00 | 240.00 | |
| | | නාඩු | | 225.00 | 230.00 | |
| | | කැකුළු | | 215.00 | 220.00 | |
| 2 | සහල් (ආනයනික) | කැකුළු | 2414/04 2024.12.09 | - | 210.00 | |
| | | නාඩු | | - | 220.00 | |
| | | සම්බා | | - | 230.00 | |
| 3 | ටින් මාළු | **ටූනා** ශුද්ධ බර ග්‍රෑම් 425 සහ දියර රහිත් බර ග්‍රෑම් 280 | 2416/29 2024.12.27 | | 380.00 | |
| | | **මැකරල්** ශුද්ධ බර ග්‍රෑම් 155 සහ දියර රහිත් බර ග්‍රෑම් 105 | | | 180.00 | |
| | | **මැකරල්** ශුද්ධ බර ග්‍රෑම් 425 සහ දියර රහිත් බර ග්‍රෑම් 280 | | | 420.00 | |
| | | **ජැක් මැකරල් (ලින්නා)** ශුද්ධ බර ග්‍රෑම් 425 සහ දියර රහිත් බර ග්‍රෑම් 280 | | | 560.00 | |

මූලාශ්‍රය : වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, වෙළෙඳ හා පර්යේෂණ අංශය

2.2 2024 වර්ෂයේ අවසන් කාර්තුවේදී පැන නැඟුන සහල් හිඟතාවය හා ඉතා ඉහළ මිල ගණන් යටතේ සහල් අලෙවි කිරීම වැළැක්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව පෞද්ගලික ආනයනකරුවන් මඟින් සහල් ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබා දුන් අතර ඒ අනුව 2024.12.02 දින සිට 2024.12.31 දක්වා කාලය තුළ සහල් මෙට්‍රික් ටොන් 83,215 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත.

2.3 ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හා ලංකා සතොස ආයතනයන් හරහා නාඩු සහල් මෙ.ටො. 70,000 ක් ආනයනය කිරීම සඳහා කටයුතු කළ අතර 2024.12.31 දින වන විට ඉන් සහල් මෙ.ටො.780 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ආනයනය කර ලංකා සතොස, සමුපකාර හා සුපිරි වෙළෙඳසැල් අලෙවි ජාලය ඔස්සේ බෙදාහැර ඇත. තවත් මෙ.ටො. 25,200 ක් සඳහා ඇණවුම් ලබා දීම සිදු කර ඇත.

2.4 2024 වසරේ අවසාන කාලය තුළ දේශීය වෙළෙඳපොළේ ඇති වූ සහල් හා පොල් හිඟයට පිළියමක් ලෙස ලංකා සතොස අලෙවිසැල් ජාලය මඟින් මෙම ද්‍රව්‍ය පාරිභෝගිකයා වෙත සාධාරණ මිලකට අලෙවි කිරීමේ විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ලංකා සතොස සමාගම මඟින් 2024 දෙසැම්බර් සිට 2025 ජනවාරි 15 දක්වා කාලය තුළ ආනයනික සහල් කිලෝ ග්‍රෑම් මිලියන 4.5 ක් පමණ මිලදී ගෙන ඇති අතර එයින් කිලෝ ග්‍රෑම් මිලියන 1.5 ක් පමණ අලෙවි කර ඇත. 2024 සැප්තැම්බර් සිට 2025 ජනවාරි 15 දක්වා දේශීය සහල් කිලෝග්‍රෑම් මිලියන 13 ක් පමණද අලෙවි කර ඇත.

2024 දෙසැම්බර් මස තුළ පොල් ගෙඩි 893,442 ක් මිලදී ගෙන ඇති අතර එයින් පොල් ගෙඩි 726,285ක් අලෙවි කර ඇත.

2.5 දේශීය ගොවීන් ආරක්ෂා කිරීම අරමුණු කොට, ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ආනයනික තීරු බදු සම්බන්ධයෙන් වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත අවස්ථානුකූලව නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම තුළින් දේශීය ගොවීන් මෙන්ම පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී. උදාහරණ: අර්තාපල්, ලොකු ළූණු හා ටින්මාළු

2.6 දේශීය වෙළෙඳපොළ තුළ ඉදිරියේදී හිඟතාවයක් ඇතිවිය හැකි ලුණු නිෂ්පාදකයන්ගේ සංගමය තුළින් ඉදිරිපත් කළ කරුණු සඳහා මේස ලුණු හිඟයකින් තොරව පාරිභෝගිකයාට ලබා දීම සඳහා සී/ස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් අයඩීන් මිශ්‍ර නොකළ ලුණු මෙ.ටො 30,000 ක් ආනයනය කිරීම සඳහා 2024.12.18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

2.7 ජාතික තත්ත්ව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධිත ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, සම්බන්ධීකරණය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික තත්ත්ව සභාව ස්ථාපිත කිරීම 2024.07.01 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කිරීම.

2.8 නිෂ්පාදකයන්, වෙළෙඳුන් සහ පාරිභෝගික ජනතාව මුහුණපානු ලබන ප්‍රශ්න හා දුක් ගැනවිලි පිළිබඳ ලැබෙන සියලු නියෝජනයන් අදාළ ආයතන වෙතට යොමු කර ඒවාට විසඳුම් ලබා දීමට කටයුතු කිරීම හා මාර්ගෝපදේශ සැපයීම.

2.9 භූගෝලීය දර්ශක ලියාපදිංචිය සඳහා 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ රෙගුලාසි පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමත කර ගැනීම.

2.10 රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුව පාරිභෝගික සුභසාධනය ආහාර සුරක්ෂිතතාවය සහ ගොවීන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම, සහතික කිරීම පිණිස වෙළෙඳපොළ මෙහෙයුම් තුළ රාජ්‍ය දායකත්වය සහතික කිරීමේදී සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ඇවර කිරීම සම්බන්ධයෙන් වන අ.ම.ප අංක 24/1712/627/001-1 දරණ 2024.09.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිරි කටයුතු සිදුකිරීම වහාම ක්‍රියාත්මකවන පරිදි අත්හිටුවීම හා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ප්‍රතිසංවිධානය කිරීම හා මෙහෙයුම් සඳහා යොදා ගැනීමට සැලසුම් කිරීම.

2.11 2024/2025 මහ කන්නයේ වී මිලදී ගෙන ගබඩා කිරීම පිණිස සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට හැකියාව ඇති කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා මහජන බැංකුව විසින් කළමනාකරණය කළ පහත සඳහන් ගබඩා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට පවරා දීම සඳහා අමප/24/2338/817/005 හා 2025/12/30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් කටයුතු කිරීම.

**ගබඩා පිළිබඳ විස්තර**

*වගු අංකය 2. 2 සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට පවරා දුන් ගබඩා*

| අංකය | ගබඩාව පිහිටි ස්ථානය | දිස්ත්‍රික්කය | ධාරිතාව (මෙට්‍රික් ටොන්) | හිමිකාරීත්වය |
|---|---|---|---|---|
| 1 | මුරුන්කන්* | මන්නාරම | 5,000 | මහා භාණ්ඩාගාරයේ ලේකම් |
| 2 | මැදිරිගිරිය* | පොළොන්නරුව | 5,000 | |
| 3 | උපුල්දෙණිය* | අනුරාධපුර | 5,000 | |
| 4 | බුත්තල* | මොණරාගල | 5,000 | |
| 5 | කිලිනොච්චි* | කිලිනොච්චිය | 5,000 | |
| 6 | ඇඹිලිපිටිය* | රත්නපුර | 5,000 | |
| 7 | දහම්පුර - මැදිරිගිරිය** | පොළොන්නරුව | 3,000 | |
| 8 | හිඟුරක්ගොඩ | පොළොන්නරුව | 4,000 | සීමාසහිත ලංකා සතොස සමාගම |
| 9 | පන්නේගමුව | හම්බන්තොට | 4,000 | |
| 10 | ඔයාමඩුව | අනුරාධපුර | 24,000 | රජයේ දිසාපති |
| මුළු ගබඩා ධාරිතාව (මෙට්‍රික් ටොන්) | | | 65,000 | |

මූලාශ්‍රය : සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව

**සටහන:** * ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් කළමනාකරණය කරනු ලබයි ** මහජන බැංකුව විසින් කළමනාකරණය කරනු ලබයි.

# තෙවන පරිච්ඡේදය

# 2024 - ප්‍රගතිය

## 03. 2024 වසරේ ප්‍රගතිය ( 2024.01.01 සිට 2024.12.31 දක්වා)

### 3.1. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

#### I. 2024.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

*වගු අංකය 3. 1 මූල්‍ය ප්‍රගතිය*

| වියදම් විස්තර | 2024 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රුපියල්) | 2024.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | (රුපියල්) | % |
| පුනරාවර්තන වියදම් | 1,323,295,000.00 | 1,007,929,990.94 | 76.17% |
| ප්‍රාග්ධන වියදම් | 34,600,000.00 | 6,755,854.22 | 19.53% |
| | **1,357,895,000.00** | **1,014,685,845.16** | **74.72%** |

මූලාශ්‍රය : වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය, ගිණුම් අංශය

#### II. අභ්‍යන්තර විගණන අංශය

අ) ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වන අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි 04ක් පවත්වා ඇත.

ආ) අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අමාත්‍යාංශයේ කටයුතු විධිමත්ව පවත්වා ගැනීම හා නිසි පිළිවෙළ ඉටු කරන්නේද යන්න විමසුම සඳහා කටයුතු කළ අතර ඒ සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 06 ක් නිකුත් කර ඒ සඳහා අදාළ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය කර ඇත.

ඇ) ලේකම් විසින් පවරන ලද විශේෂ විමර්ශන හා මුලික විමර්ශන 06ක් සිදු කර ඇති අතර එහි විස්තර පහත දැක්වේ.

*වගු අංකය 3. 2 විශේෂ විමර්ශන හා මූලික විමර්ශන*

| අනු අංකය | දිනය | යොමු අංකය | විෂය | අදාළ ආයතනය |
|---|---|---|---|---|
| 01. | 2024.06.05 | MT/IA/SPAU/2024/1 | කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ පත්වීම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම. | වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය |
| 02. | 2024.07.31 | MT/IA/SPAU/2024/2 | වාණිජ දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව හා වට්ටෝරු භාණ්ඩවල තොරතුරු පිළිබඳ විශේෂ විමර්ශන | වාණිජ දෙපාර්තමේන්තුව |
| 03. | 2024.09.19 | MT/IA/SPAU/2024/3 | ලලිත් ඇතුළත් මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල කළමනාකරණ පරීක්ෂාවට අදාළ විශේෂ විගණන වාර්තාව | ලලිත් ඇතුළත් මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල |
| 04. | 2024.11.24 | MT/IA/SPAU/2024/4 | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරීන්ගෙන් සිදුවන අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විශේෂ විගණන විමර්ෂණය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |
| 05. | 2024.12.03 | MT/IA/SPAU/2024/5 | අමාත්‍යාංශය සඳහා 2024/2025 වර්ෂය වෙනුවෙන් පවිත්‍රතා සේවාව සැපයීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ පෙත්සම සම්බන්ධ විශේෂ විගණන විමර්ෂණ වාර්තාව | වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය |
| 06. | 2024.12.11 | MT/IA/SPAU/2024/6 | වාණිජ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තරයේ ඇති දූෂණ වංචා දැන්වීමයි යන මැයෙන් ඉදිරිපත් කර ඇති නිර්නාමික ලිපියේ සඳහන් කරුණු පිළිබඳ විශේෂ විගණන වාර්තාව | වාණිජ දෙපාර්තමේන්තුව |

මූලාශ්‍රය : වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, අභ්‍යන්තර විගණන අංශය

## III. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**අ) තාරපුරම් සමුපකාර ගම්මාන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්බන්ධව අංක අමප/ 24/0503/627/011 හා 2024.04.01 දිනැති කැබිනට් තීරණය ප්‍රකාරව 2024.03.11දින යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3 ඡේදයේ 3.1 අනුඡේදයෙහි දක්වා ඇති පරිදි කටයුතු කිරීම සඳහා අනුමැතිය ලැබිණ. ඒ අනුව, අතරමඟ නවතා ඇති මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා මුදල්,සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ජාතික නියෝජිතායතනය (NAPPP) හරහා සුදුසු ව්‍යාපෘතියකට මෙය යොදවා ගැනීමට යෝජනා වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයෙහි අයවැය මඟින් රු.මිලියන 54ක් වෙන්ව තිබුණ ද ගෙවීම් කටයුතු කිරීමේ දී ඇති වූ ගැටලු සහගත තත්වයන් අරහයා එය සිදු කිරීමට නොහැකි විය.

ඒ අනුව, අදාළ අමාත්‍යමණ්ඩල උපදෙස් මත මේ වන විට NAPPP ආයතනය සමග මේ සම්බන්ධව සාකච්ඡා කර ඇති අතර, එම යෝජනාව ක්‍රමවත්ව ක්‍රියාත්මක නොවූ බැවින්, මේ වන විට ව්‍යාපෘතියේ ඉදිරිකටයුතු සම්බන්ධයෙන් නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කිරීමට කටයුතු කරමින් පවතී

**ආ) දක්ෂිණ සංවර්ධන ව්‍යාපෘතිය**

2024 වර්ෂයෙහි මෙම ව්‍යාපෘතියේ බිල්පත් පියවීම සඳහා අයවැය ප්‍රතිපාදන මඟින් රු.මිලියන 87ක් වෙන්ව තිබුණ ද, ගෙවීම් කටයුතු කිරීම ගැටලු සහගත බැවින් 2024.12.31 වන දිනටත් ගෙවීම් කටයුතු කිරීමට නොහැකි විය. ඒ අනුව, මෙම ලිපිගොනු හා බිල්පත් වල ගෙවීම් කටයුතු කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයක් වෙත යොමු කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල තීරණයක් ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**ඇ) ආහාර සුරක්ෂිතතාව සඳහා වූ ඒකාබද්ධ ව්‍යාපෘතිය (රු.මි. 250)**

ව්‍යාපෘතිය සකස් කර තිබුණද ජනාධිපතිවරණ මැතිවරණ නීති යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම අමාත්‍යාංශය වෙත 2024.08.01 දින යොමු කරන ලද ලිපිය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නතර කිරීමට සිදු විය.

**ඇ) ආහාර සුරක්ෂිතතාව සඳහා අඩු ආදායම්ලාභී කාන්තා ව්‍යවසායකයින් නඟාසිටුවීමේ ව්‍යාපෘතිය (රු.මි. 100)**

ව්‍යාපෘතියේ කර්තව්‍යයන් වෙනුවෙන් රු.මිලියන 6.5 සී/ස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ගෙවා ඇත.

මෙම ව්‍යාපෘතිය ජනාධිපතිවරණ මැතිවරණ නීති යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම අමාත්‍යාංශය වෙත 2024.08.01 දින යොමු කරන ලද ලිපිය හේතුවෙන් තාවකාලිකව නතර කිරීමට සිදු විය.

## IV. ආයතනික කටයුතු

අ) ලලිත් ඇතුළත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2024.09.12 දින පවත්වන ලද අතර ලලිත් ඇතුළත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි අනුමත තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර ඇත.

ආ) ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ පනත යටතේ භූගෝලීය දර්ශක ලියාපදිංචිය යටතේ රෙගුලාසි සකස් කිරීමට කටයුතු කිරීම හා මැඩ්රිඩ් සංවිධාන පත්‍රය යටතේ වෙළඳ ලකුණ ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමට අදාළව බුද්ධිමය දේපළ පනතට ඇතුළත් කළයුතු සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කරන ලදී.

ඇ) 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරි පනත මඟින් පිහිටුවා ඇති එම අධිකාරිය එහි අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිර්දේශ ලබාගැනීමට පත් කළ කමිටුවේ වාර්තාව 2024.04.18 දින පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති අතර, එහිදී එක් එක් අංශයන් යටතේ සිදු කළ යුතු වෙනස්කම් සම්බන්ධ නිර්දේශ එම ආයතනය වෙත ලබා දී මාර්ගෝපදේශ ලබා දී ඇත.

ඈ) මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ සහකාර මිනුම් ඒකක, ප්‍රමිති සේවා නිලධාරී සහ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරී තනතුරට අදාළ සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර. තවද, 1995 අංක 35 දරන මිනුම් ඒකක හා ප්‍රමිති සේවා පනත සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කිරිමට කටයුතු කර ඇත.

ඉ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සමාලෝචනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරි යෝජනා ඉදිරිපත් කර ඇති අතර එම ඉදිරිපත් කරන ලද යෝජනා සමාලෝචනය කර 2024.08.12 වන දින අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය නිශ්චිතව හඳුනා ගෙන ඒ පිළිබඳ වාර්තාවක් සකස් කර ඇත.

### V. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සකස් කිරීම

2023.08.11 දින වන විට සමාලෝචන කමිටුව වෙතින් ලබාදෙන ලද අදහස් පාදක කොට ගනිමින් 2024 වර්ෂයේදී වෙළෙඳ ප්‍රතිපත්තියේ දෙවන කෙටුම්පත සකස් කර ජනාධිපති කාර්යාලයේ අපනයන ප්‍රවර්ධන අංශයේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලදී. තවද මෙම අමාත්‍යාංශය විසින් සකස් කරන ලද කෙටුම්පත් සංකල්ප සටහන සමාලෝචනය කිරීමෙන් පසු, එක්සත් ජාතීන්ගේ වෙළඳාම සහ සංවර්ධනය සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත.

### VI. ශ්‍රී ලංකාවේ ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය

"ශ්‍රී ලංකාවේ ජාතික ඇගයුම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සියලු රාජ්‍ය ආයතනවල වගකීම හා කාර්යභාරය" මැයෙන් වූ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ චක්‍රලේඛන අංක: 01/2024 ට අනුව 2025 මුදල් වර්ෂයේ දී රාජ්‍ය අයවැය මඟින් ප්‍රතිපාදන වෙන්කර ගැනීම සඳහා ව්‍යාපෘති ඇගයීම සඳහා යෝජනා කැඳවනු ලැබීය.

අ) ඒ අනුව,මේ වන විට ඉදිකිරීම් කටයුතු අවසන් වෙමින් පවතින මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවයෙන් යුත් කෘෂි නිෂ්පාදන උෂ්ණත්වයකින් පාලනය සහිතව ගබඩා කළහැකි ගබඩා සංකීර්ණ ව්‍යාපෘතිය ඇගයීම් වැඩසටහනට ඉදිරිපත් කරනු ලදුව ඒ සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

ආ) එම ඇගයීම් වැඩසටහන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2025 අයවැය යටතේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ වෙන් කර ඇත.

## b. වාණිජ දෙපාර්තමේන්තුව

### I. බහුපාර්ශවීය කටයුතු අංශය

#### අ) ලෝක වෙළඳ සංවිධානය (WTO)

ලෝක වෙළඳ සංවිධානයේ (WTO) 13 වන අමාත්‍ය සමුළුව 2024 පෙබරවාරි 26 සිට මාර්තු 1 දක්වා අබුඩාබි හි පවත්වන ලද අතර, වෙළඳ ගැටළු සම්බන්ධයෙන් බහුපාර්ශ්වික සාකච්ඡා පවත්වන ලදී.

කෘෂිකාර්මික සාකච්ඡා සහ ධීවර සහනාධාර ගිවිසුම් 2 වැනි අදියර සාකච්ඡා වැනි කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව G33 සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ එක් වූ අතර ධීවර ප්‍රජාවගේ සුවිශේෂී ආර්ථික කලාප (EEZ) තුළ ධීවර ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාත් වැඩි නම්‍යශීලී ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහාත් පෙනී සිටියහ.

ගරු අමාත්‍යවරයා ඊශ්‍රායලයේ වෙළඳ අමාත්‍යවරයා සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පවත්වන ලද අතර ෆින්ලන්තය, නෙදර්ලන්තය සහ ස්වීඩනය යන රටවල වෙළඳ අමාත්‍යවරුන් විසින් සත්කාරකත්වය සපයන ලද WTO නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) විසින් සපයනු ලබන සහාය පිළිබඳව අවධානය යොමු කරන ලද විද්වත් සාකච්ඡාවකට ද එක් විය.

WTO සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාවේ අවසන් වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය 2016 දී පවත්වන ලද අතර මීළඟ සමාලෝචනය 2025 ඔක්තෝම්බර් 15 සහ 17 යන දිනවල පැවැත්වීමට නියමිතය. ඒ සඳහා WTO මහලේකම් කාර්යාල වාර්තාවේ වැඩ ආරම්භ කිරීම සඳහා ඔවුන් විසින් එවන ලද ප්‍රශ්නාවලියට අදාළ සවිස්තරාත්මක තොරතුරු දෙපාර්තමේන්තුව විසින් අදාළ ආයතන (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, මණ්ඩල, ආදිය) සම්බන්ධීකරණය කරගනිමින් සපයා ඇත.

**උස්බෙකිස්තානය සමඟ WTO ප්‍රවේශ වීමේ සාකච්ඡා -** ශ්‍රී ලංකාව උස්බෙකිස්තානයට තේ අපනයනය සඳහා උනන්දුවක් දක්වන බැවින්, දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග එක්ව කළු තේ සඳහා අවම බැඳුම් තීරු බදු ගාස්තු අනුපාත සහ මූලික සාකච්ඡා අයිතිය (INR) ලබා ගනිමින් ශ්‍රී ලංකාව උස්බෙකිස්තානය අතර ලෝක වෙළෙඳ සංවිධානයට උස්බෙකිස්තානය ප්‍රවේශ වීමේ සාකච්ඡා අවසන් කරන ලදී.

#### ආ) WTO/EU/FAO/IFAD/WFP හි ශ්‍රී ලංකාවේ නියෝජනය පිළිබඳ ක්‍රියාකාරකම්

බහුපාර්ශ්වික ක්ෂේත්‍රය තුළ රටේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ජිනීවා දූත මණ්ඩලය, කෘෂිකර්ම සාකච්ඡා, වෙළඳ පහසුකම්, ධීවර සහනාධාර, WTO ප්‍රතිසංස්කරණ සහ වෙළඳ හා සංවර්ධන ක්ෂේත්‍ර ඇතුළු බහුපාර්ශ්වික රැස්වීම් 69කට සහභාගී විය. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි පැවති 13 වැනි ලෝක වෙළඳ සංවිධානයේ අමාත්‍ය සමුළුව (MC13) සහ 2025 දී 5 වැනි වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය සඳහා සූදානම් වීම සහ සහභාගී වීම සම්බන්ධ අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ ජිනීවා දූත මණ්ඩලය ලෝක වෙළෙඳ සංවිධානයේ කමිටු සාකච්ඡා සඳහා එක්වෙමින් ආහාර සුරක්ෂිතතාව, කෘෂිකර්මාන්තය, ධීවර සහනාධාර සහ සංවර්ධන ගැටළු වැනි ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ලිඛිත හා වාචික මැදිහත්වීම් 43 ක් සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ඉදිරියට ගෙන යාම සඳහා ද්විපාර්ශ්වික සහ කණ්ඩායම් රැස්වීම් 25 ක් ද පවත්වන ලදී.

**තාක්ෂණික සහය සහ සංවර්ධන කුසලතා ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම-** වෙළඳ ප්‍රතිපත්තිය, සේවා වෙළඳාම, සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) ගිවිසුම සහ වෙළඳ පහසුකම් සැපයීම වැනි WTO ගිවිසුම්වල රාජ්‍ය නිලධාරීන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් සහ වැඩමුළු කිහිපයකින් ශ්‍රී ලංකාව ප්‍රතිලාභ ලබයි.

ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ UNCTAD වැනි සංවිධානවල සහාය ඇතිව ශ්‍රී ලාංකික නිලධාරීන් සඳහා දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් 12 ක් ශ්‍රී ලංකාවේ ජිනීවා දූත මණ්ඩලය සුරක්ෂිත කර ඇත.

**ද්විපාර්ශ්වික ප්‍රවර්ධන කටයුතු-** ශ්‍රී ලාංකික ව්‍යාපාරවලට ස්විට්සර්ලන්තයේ අවස්ථා ගවේෂණය කිරීමට උපකාර කරමින්, මූලික වශයෙන් ධීවර, කුළුබඩු සහ සැකසූ ආහාර සම්බන්ධ අපනයන වෙළඳ විමසීම් 14කට මෙම මෙහෙයුම පහසුකම් සැලසීය. මීට අමතරව, "WTO විවෘත දිනය", සහ ස්විස්-ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය පුනර්ජීවනය කිරීමේ උත්සාහයන් ඇතුළුව ප්‍රවර්ධන වැඩසටහන් 11 ක් සංවිධානය කරන ලදී.

**කැපී පෙනෙන ජයග්‍රහණ-** ප්‍රධාන ජයග්‍රහණ අතරට තීරණාත්මක වෙළඳ සාකච්ඡාවලදී ශ්‍රී ලංකාවේ අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සහ WTO ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට රටේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා ගැනීම ඇතුළත් වේ. UNCTAD සහ ITC සමග සහයෝගීතා ප්‍රයත්නයන් ශ්‍රී ලංකා වෙළඳ ප්‍රතිපත්ති රාමුව සංවර්ධනය කිරීමේ ප්‍රගතියට සහ WTO වෙළඳ පහසුකම් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට හේතු විය. 2005 වසරේ සිට ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාවලියක ප්‍රධාන පියවරක් සනිටුහන් කරමින් උස්බෙකිස්තානය සමඟ එක්වීමේ සාකච්ඡා අවසන් වීම කැපී පෙනෙන සන්ධිස්ථානයක් විය.

**ඇ) වෙළඳාම් පහසුකරණ ගිවිසුම (TFA)**

2023 ජුනි මස ජනාධිපති ලේකම් කාර්යාලයේදී මුදල් අමාත්‍යාංශයේ සභාපතිත්වය යටතේ ජාතික වෙළඳ පහසුකරණ කමිටුවේ (NTFC) කාර්තුමය රැස්වීම් පැවැත්වීමට ගත් තීරණයට අනුව, 2024 අගෝස්තු 27 වන දින NTFC හි 01 වන සහ 02 වන කාර්තුමය රැස්වීම් පවත්වන ලදී.

වෙළඳ පහසුකරණ ගිවිසුමට අදාළ වගන්ති කීපයක් අවසාන දිනට පෙර නිම කිරීම පිලිබඳව WTO වෙත දැනුම් දීමක් කරනු ලැබිණි. එම වගන්ති නම්; 2.2 – උපදේශන (Consultations), 7.3 – රේගු බදු සහ අනෙකුත් ගාස්තු අවසාන තීරණයෙන් නිදහස් කිරීම වෙන් කිරීම සහ 7.5 – පසු නිෂ්කාශන විගණනය යන ඒවාය.

2024 දී ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලෝක බැංකුව (WB) විසින් NTFC වෙත තාක්ෂණික (Technical Assistance) ධාරිතා ගොඩනැගීම (Capacity Building) පිළිබඳ සහාය ලබා දෙන ලදී. අවදානම් කළමනාකරණය සඳහා ලෝක බැංකුව ද රේගු ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ද බොහෝ දුරට සහාය ලබා දෙන ලදී.

ජාතික තනි කවුළු (NSW) පද්ධති ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා මුදල් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට (PIU) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ (PIC) සාමාජිකයෙකු ලෙස අවශ්‍ය තොරතුරු හා සහය ලබා දෙන ලදී.

**ඇ) වෙළෙඳ ප්‍රතිකර්ම නීති ක්‍රියාත්මක කිරීම**

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පැනවීම පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම සඳහා වන මූලික රෙගුලාසි වාණිජ දෙපාර්තමේන්තුව විසින් අවසන් කර ප්‍රකාශනය සඳහා වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත යවන ලදී. විමර්ශන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අදාළ මෙහෙයුම් මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර චක්‍රලේඛ වාණිජ දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලදී.

**ඉ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයින්/අපනයනකරුවන්ට එරෙහිව වෙනත් රටවල් විසින් ආරම්භ කරන ලද විමර්ශන**

කාම්බෝජය සහ ශ්‍රී ලංකාව යන රටවලින් කඩදාසි ගොනු කවර ආනයනය කිරීම සම්බන්ධයෙන් ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන පියවර පැනවීම පිළිබඳ විමර්ශනය 2022 නොවැම්බර් 12 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ වාණිජ දෙපාර්තමේන්තුව (USA-DoC)විසින් ආරම්භ කරන ලදී.

2024 අගෝස්තු 29 වන දින යුරෝපා සංගමය විසින් චීනයෙන් ආනයනය කරනු ලබන බයිසිකල් සඳහා පනවා ඇති ප්‍රපාතන විරෝධී ක්‍රියාමාර්ගය පිළිබඳ සමාලෝචනය ආරම්භ කරන ලද අතර එය ඉන්දුනීසියාව, මැලේසියාව, ශ්‍රී ලංකාව සහ ටියුනීසියාව යන රටවලින් ආනයනය කරන ලද භාණ්ඩ සඳහා ද දීර්ඝ කර ඇති ප්‍රතිකර්මයකි. එම නිසා ශ්‍රී ලංකාවේ බයිසිකල් අපනයනකරුවන්ද මෙම නැවත සමාලෝචනයෙහි පාර්ශවකරුවන් වේ. කාම්බෝජය, ඉන්දුනීසියාව, මැලේසියාව, පකිස්ථානය, පිලිපීනය, ශ්‍රී ලංකාව සහ ටියුනීසියාව යන රටවලින් බයිසිකල් සහ ඇතැම් බයිසිකල් අමතර කොටස් ආනයනය කිරීමට එරෙහිව 2024.08.23 දින ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන විරෝධී බදු සඳහා එක්සත් රාජධානියේ සංක්‍රාන්ති සමාලෝචනය ද ආරම්භ කරන ලදී.

මෙම විමර්ශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ රජයේ පාර්ශවකරුවන් සහ නිෂ්පාදකයින් සමඟ සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීය.එපමනක් නොව, චීනයේ සිට යුරෝපා සංගමයට සහ එක්සත් රාජධානියට බයිසිකල් නිෂ්පාදන සඳහා පනවා ඇති ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන විරෝධී බදු මගහැරීම සම්බන්ධයෙන් එල්ල වූ චෝදනා මත මෙම පරීක්ෂණ පදනම් වී ඇති බැවින් මෙම විමර්ශනය සඳහා සහභාගී විය හැකි ක්‍රම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ පාපැදි නිෂ්පාදකයින්ට සහ අපනයනකරුවන්ට දැනුම් දෙන ලදී.

**වෙළෙඳ ප්‍රතිකර්ම සම්බන්ධ ගැටළු පිළිබඳ උපදෙස් ලබා දීම**: ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට සහ ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති මෙට්ට සහ සූර්ය මොඩියුල වැනි කර්මාන්තශාලා කිහිපයක් සම්බන්ධයෙන් ඇමරිකා එක්සත් ජනපදය සහ අනෙකුත් රටවල් විසින් ආරම්භ කළ හැකි වෙළඳ පුතිකර්ම විමර්ශන සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට උපදෙස් ලබා දෙන ලදී. එසේම දෙපාර්තමේන්තුවේ වෙළඳ ප්‍රතිකර්ම ඒකකය විසින් ලෝකයේ ඉස්සන් සැකසුම්, සූර්ය පැනල කර්මාන්ත සහ ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයට එම ක්ෂේත්‍රවල ආයෝජනයට ඇති අවස්ථා සහ වෙනත් රටවල් විසින් පැනවිය හැකි වෙළඳ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හේතුවෙන් ඇති විය හැකි අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව පර්යේෂණ සිදු කරන ලදී.

**ඊ) තාක්ෂණික සහාය (Technical Assistance)**

WTO හි සම්පත්දායකයින් සමඟ ජාතික වැඩමුළු දෙකක් පවත්වන ලදී. ඉන් පළමු වැඩමුළුව 2024 පෙබරවාරි මාසයේදී WTO හි ශාක හා සත්ත්ව ස්වස්ථතාවය පිළිබඳ ගතයුතු පියවර සම්බන්ධ ගිවිසුම පිළිබඳව සහ අනෙක් වැඩමුළුව 2024 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ වෙළඳ පහසුකරණ ගිවිසුම සහ එහි අනාගතය පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම වැඩමුළු දෙකම පෞද්ගලික සහ රාජ්‍ය අංශ දෙකෙන්ම ආසන්න වශයෙන් 60 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විය.

2023 නොවැම්බර් සහ 2024 මාර්තු මාසවල ශාක හා සත්ත්ව ස්වස්ථතාවය පිළිබඳ ගතයුතු පියවර සම්බන්ධ ගිවිසුමේ (SPS) WTO කමිටු රැස්වීම්වලට සහභාගී වීම සඳහා ඇමරිකා එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුව යටතේ ඇති වාණිජ නීති සංවර්ධන වැඩසටහන (CLDP) සමඟ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ FCAU ඒකකයට සහාය ලබා දීම.

2024 මැයි මාසයේදී ITC හි ආසියා පැසිෆික් කලාපීය නියෝජිතයින්ගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර, TFA ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙනුවෙන් ITC වෙතින් තාක්ෂණික ලබා ගැනීමට TFA හි තෝරාගත් කොටස් කීපයක් සම්බන්ධයෙන් ලෝක බැංකුව විසින් සපයන ලද ධාරිතා ගොඩනැගීමේ (Capacity Building) වැඩසටහන් සම්බන්ධීකරණය කරන ලදී.

ධීවර අමාත්‍යාංශයේ සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ WTO හි විශේෂඥයින් ඇතුළුව WTO හි ධීවර සහනාධාර ගිවිසුම පිළිබඳ දැනුවත් කිරීමේ සැසි සම්බන්ධීකරණය කරන ලදී.

WTO හි TFAF වෙත ඉදිරිපත් කිරීමට නියමිත යෝජනාව සකස් කිරීම සඳහා ITC සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සම්බන්ධීකරණයෙන් පූර්ව නීති (Advance Rulings) යටතේ තාක්ෂණික සහය ලබා ගැනීමට අදාල යෝජනා සකස් කෙරිණි.

## II. ද්විපාර්ශවීය කටයුතු අංශය

### අ) ඕස්ට්‍රේලියාව-ශ්‍රී ලංකා වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුම; කාර්තුමය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්

2024 මැයි සහ ඔක්තෝබර් මාසවලදී ඕස්ට්‍රේලියාව-ශ්‍රී ලංකාව අතර වෙළඳ සහ ආයෝජනය පිළිබඳව රාමුගත සැකැස්ම (Trade and Investment Framework Arrangement-TIFA) යටතේ පිහිටුවා ඇති ක්‍රියාකාරී කණ්ඩායමේ (Working Group) කාර්තුමය රැස්වීම් දෙකක් පැවැත්විණි. ආයෝජන, කෘෂිකර්මාන්තය, දැනුම බෙදාගැනීම සහ තාක්ෂණික සහාය කෙරෙහි අවධානය යොමු කරමින් දෙපාර්ශ්වය එක්ව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ සාකච්ඡා කිරීම එහිදී සිදු විය. ඒ අනුව පසු ගිය වසර තුලදී ශ්‍රී ලංකාවේ පතල් ව්‍යාපෘති සහ කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා තාක්ෂණික සහාය සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත.

### ආ) වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායම

වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීමක් (Working Group Meeting) 2024 පෙබරවාරි 06 වන දින දෙපාර්ශ්වයේ ඉහළ මට්ටමේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මාර්ග ගත ක්‍රමයට පැවැත්විණි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු අතර ආර්ථික හා වෙළඳ ප්‍රතිපත්ති සංවර්ධනය, ද්විපාර්ශ්වික වෙළඳපල ප්‍රවේශ ගැටළු, වන විනාශය නියාමනය ඇතුළු යුරෝපා සංගමයේ නියාමන සංවර්ධනයන් (Regulatory Developments), GSP යෝජනා ක්‍රමය සහ වෙළඳ කටයුතු සඳහා සහාය ලබා දීම ඇතුළත් විය. ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේදී, ශ්‍රී ලංකා පාර්ශ්වය විසින් රට තුළ ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගැනීම සඳහා කරන ලද ප්‍රධාන ප්‍රතිපත්ති මැදිහත්වීම් (Policy Interventions) ඉස්මතු කළේය. දැනට සාකච්ඡා කෙරෙමින් පවතින නව GSP යෝජනා ක්‍රමයේ විශේෂාංග යුරෝපා සංගම් පාර්ශ්වය විසින් ඉස්මතු කළේය. තවද නියාමන අනුකූලතාව යන් සඳහා අවශ්‍ය වන තාක්ෂණික සහාය සහ වෙළඳපල ප්‍රවේශ ය සඳහා වන සහතික කිරීම්වලට අදාල ගැටළු විසඳීම ඇතුළු විභව සහයෝගීතාව (Potential Cooperation) සඳහා වන තවත් ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව ද දෙපාර්ශ්වය සාකච්ඡා කළහ. වෙළඳාමට අදාළ ගැටළු විසඳීමේදී සහ අනාගතයේදී ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමේදී අනාගතයේදී ඵලදායී සංවාද අඛණ්ඩව පවත්වාගෙන යාමේ වැදගත්කම දෙපාර්ශ්වයම අනුමත කළහ.

ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීමේ ප්‍රගතිය පිළිබඳව 2024 පෙබරවාරි 22 වන දින පැවති 26 වන යුරෝපා සංගම්-ශ්‍රී ලංකා ඒකාබද්ධ කොමිසමට (EU-Sri Lanka Joint Commission) වාර්තා කරන ලදී.

**ඇ) EU GSP යෝජනා ක්‍රමය යටතේ ඉන්දුනීසියානු රෙදිපිළි භාවිතා කරමින් ඇඟලුම් අපනයනය සඳහා අන්තර් කලාපීය සමුච්චන පහසුකම**

HS පරිච්ඡේද 51 සිට 55, 58 සහ 60 යටතට ගැනෙන ඉන්දුනීසියානු සම්භවයක් ඇති රෙදිපිළි සහ ද්‍රව්‍ය භාවිතා කර EU කලාපය අරමුණු කර HS පරිච්ඡේද 61,62 සහ 63 යටතට ගැනෙන ඇතැම් රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදනය කිරීම සඳහා සහ එවැනි නිෂ්පාදන සඳහා EU GSP යෝජනා ක්‍රමය යටතේ තීරුබදු සහන සඳහා සුදුසුකම් ලබා දෙමින්, ඒ සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව විසින් කරන ලද ඒකාබද්ධ අයදුම්පතට 2024 ජූලි 09 වන දින යුරෝපීය කොමිසම හිතකර තීරණයක් ගෙන ඇත. රටවල් දෙකම GSP ප්‍රතිලාභී රටවල් ලෙස පවතින තාක් කල් මෙම සහනය දිගටම පවතිනු ඇත.

**ඈ) එක්සත් රාජධානියේ සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය (DCTS)**

ශ්‍රී ලංකාව 2023 දී UK DCTS හි ප්‍රතිලාභියෙකු බවට පත්විය. DCTS යටතේ එක්සත් රාජධානියට අපනයනය කරන විට ඉන්දුනීසියානු රෙදිපිළි භාවිතයෙන් නිෂ්පාදනය කරන ලද ඇඟලුම් නිෂ්පාදන සඳහා තීරුබදු සහන ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ඉන්දුනීසියාව සමඟ ඒකාබද්ධව අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

**ඉ) ඉරානය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාව සඳහා වූ ඒකාබද්ධ කොමිසමේ 12 වන සැසිවාරය**

රෙබ්‍ය අමාත්‍යාංශ සහ ශ්‍රී ලාංකික පාර්ශවකරුවන් සමඟ පැවැත්වීමට නියමිත සැසිවාරය පිළිබඳව මූලික රැස්වීම් පවත්වන ලද අතර 2024 තුන් වන වන කාර්තුව තුළ 12 වන සැසිවාරය පැවැත්වීම සඳහා ඉරාන පාර්ශවයට දින නියමයන් යෝජනා කරන ලදී. කෙසේ වෙතත්, එම කාලය තුළ පැවැත්වීමට නියමිත වූ මැතිවරණ හේතුවෙන්, එම සැසිය 2025 දෙවන කාර්තුව දක්වා කල් දමා ඇත.

**ඊ) එක් තීරයක් සහ එක් මාර්ගයක් සංකල්පය (Belt and Road Initiative) යටතේ ශ්‍රී ලංකාව සහ චීනය අතර සංවර්ධන සහයෝගීතාව**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවා ලෙස චීනයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් වාණිජ දෙපාර්තමේන්තුව එක් තීරයක් සහ එක් මාර්ගයක් සංකල්පය මුලපිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයට නිර්දේශ /යෝජනා ලබා දෙන ලදි. නිදහස් වෙළඳ ගිවිසුමේ සාකච්ඡාවල තාක්ෂණික ස්වභාවය සැලකිල්ලට ගෙන, නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා එක් තීරයක් සහ එක් මාර්ගයක් සංකල්පය වෙන්ව සැලකීමෙ වැදගත්කම දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලදි.

**උ) මාලදිවයින සහ ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ කොමිසම යටතේ ප්‍රගතිය යාවත්කාලීන කිරීම**

මාලදිවයින සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩව දරන උත්සාහයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාව සහ මාලදිවයින අතර යෝජිත ඒකාබද්ධ වෙළඳ ක්‍රියාකාරී කණ්ඩායම (JWGT) සඳහා කෙටුම්පත් නියමයන් (TOR) පිළිබඳ සිය නිරීක්ෂණ වාණිජ දෙපාර්තමේන්තුව (DOC) සමාලෝචනය කර අවසන් කර ඇත. මෙම නිරීක්ෂණ අදාළ බලධාරීන් වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අතර, එය දෙරට අතර වෙළඳ හා ආර්ථික සහයෝගීතාව ශක්තිමත් කිරීම අරමුණු කරගත් JWGT පිහිටුවීම සඳහා ප්‍රධාන පියවරක් සනිටුහන් කරයි.

**ඌ) ශ්‍රී ලංකා-රුසියා වෙළෙඳ, ආර්ථික, විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය කොමිසම**

දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහයෝගිත්වයෙන් දෙරට අතර යෝජිත රේගු සහයෝගීතා ගිවිසුම පිළිබඳ නිරීක්ෂණ ලබා දුන් අතර, මෙම නිරීක්ෂණ අදාළ පාර්ශවකරුවන් අතර බෙදා හරින ලදී.

**එ) ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන සහ අනෙකුත් ද්විපාර්ශ්වික විධිවිධාන**

සමාලෝචන කාලය තුළ, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පහත සඳහන් රටවල් සඳහා පවත්වන ලද ද්විපාර්ශ්වික දේශපාලන උපදේශන සඳහා වෙළඳ හා ආර්ථික සබඳතා පිළිබඳ යෙදවුම් දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී; එක්සත් රාජධානිය, ස්විට්සර්ලන්තය, ටර්ක්මෙනිස්තානය, භූතානය, ජර්මනිය, එස්තෝනියාව.

ශ්‍රී ලංකාව සහ ඩොමිනිකන් ජනරජය අතර වෙළඳ ආයෝජන සහ නිෂ්පාදන දාමය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමක් පිහිටුවීම පිළිබඳ යෝජිත අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත සංශෝධනය කිරීම සඳහා නිර්දේශ /යෝජනා-දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

**ඒ) ශ්‍රී ලංකාව - ඊජිප්තු වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසම (JCTEC)**

ඒකාබද්ධ කොමිසමෙහි 3 වන සැසිවාරය සඳහා සූදානම් වීමේ කොටසක් ලෙස රෙඛිය අමාත්‍යංශ සහ ශ්‍රී ලාංකික පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවක් වාණිජ දෙපාර්තමේන්තුවේදී පවත්වන ලදී.

**ඔ) ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසම**

ශ්‍රී ලංකාව සහ තුර්කිය අතර ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ 3 වන සැසිවාරය කැඳවීම සඳහා පාර්ශ්වකරුවන්ගෙන් යෝජනා ලබා ගන්නා ලදී.

**ඕ) සාකච්ඡා මට්ටමේ පවතින නිදහස් වෙළඳ ගිවිසුම්**

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ කාර්යාලය (Office for International Trade – OIT) විසින් ඉන්දියාව, චීනය, තායිලන්තය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම් සහ ඉන්දුනීසියාව සහ බංග්ලාදේශය සමඟ වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා සම්බන්ධීකරණය කරන ලදී. භාණ්ඩ වෙළඳාම, ප්‍රභවස්ථාන නීති, SPS සහ TBT, වෙළඳ පිළියම්, සේවා වෙළඳාම, රේගු සහයෝගීතාවය සහ වෙළඳ පහසුකම් සැපයීම ආයෝජනය ඇතුළු උප කමිටු සඳහා සභාපති, සම සභාපති සහ සාමාජික යන තනතුරු දරමින් දෙපර්තෙමේන්තු නිලධාරීන් අවශ්‍ය සියලු වාර්තා සහ තාක්ෂණික යෙදවුම් අදාළ කමිටු සඳහා සපයන ලදී.

## III. කලාපීය කටයුතු අංශය

**අ) ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානයේ වෙළඳ හා ආයෝජන පිළිබඳ කාර්යය කණ්ඩායම (IORA-WGTI)**

2024 නොවැම්බර් 27 වැනි දින මාර්ගගතව පවත්වන ලද ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානයේ වෙළඳාම සහ ආයෝජන පිළිබඳ කාර්යය කණ්ඩායමේ (WGTI) -IORA 23 වැනි රැස්වීමට ශ්‍රී ලංකාව සහභාගි විය. රැස්වීමේදී නියෝජිතයින් 2 වන WGTI කාර්යය සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාවේ නිරත වූ අතර UNCTAD හි සම්පත් දායකයෙකුගේ සහභාගීත්වයෙන් සැපයුම් දාමයේ ප්‍රත්‍යාස්ථතාවයේ වෙළඳාමේ සහ ආයෝජනයේ කාර්යභාරය පිළිබඳ උපායමාර්ගික සාකච්ඡාවක් පැවැත්විණි.

IORBF හි සභාපතිවරයා ලෙස ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව, " ඉන්දියානු සාගර කලාපීය වෙරළාසන්න රටවල සංවිධානයේ ව්‍යාපාරික සමුළුව "තිරසාර වර්ධනය - සීමා මායිම්"" යන තේමාව යටතේ මැයි 28 සිට 29, 2024 කොළඹ ෂැංග්‍රි-ලා හිදී පැවැත්විය.

ව්‍යාපාරික සමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ IORA සාමාජික රටවල් 23ක සහ කෘෂිකාර්මික, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, සැපයුම්, පුනර්ජනනීය බලශක්ති, සංචාරක, කුඩා හා

මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ කාන්තා සවිබල ගැන්වීම යන තෝරාගත් ක්ෂේත්‍රවල සංවාද හවුල්කරුවන් 12ක ව්‍යාපාරික නායකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ පාර්ශවකරුවන් අතර සංවාදය, ජාලකරණය සහ සහයෝගීතාව වර්ධනය කිරීමයි. මෙම අවස්ථාවට නියෝජිතයින් ආවරණය වන පරිදි 300+ ක සම්පූර්ණ සහභාගීත්වයක් තිබුණි.

**ආ) බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල ප්‍රවේශයේ නිදහස් වෙළඳ කලාපය (BIMSTEC FTA)**

නිදහස් සහ වරණීය වෙළඳ ගිවිසුම් (FTA/PTA) යටතේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන් සමාලෝචනය කිරීම සඳහා 2021.02.08 දිනැති කැබිනට් තීරණයට අනුව, BIMSTEC නිදහස් වෙළඳ කලාපය යටතේ HS 2017 හි තීරුබදු සහන නැවත සකස් කිරීම සිදු වෙමින් පවතී. BIMSTEC ලේකම් කාර්යාලය විසින් වෙළඳ සාකච්ඡා කමිටුවේ (TNC) 22 වන රැස්වීම, BIMSTEC ලේකම් කාර්යාලය විසින් ප්‍රභවස්ථාන නීති (WG-ROO) පිළිබඳව BIMSTEC කාර්යය 22 වන රැස්වීම 2024 සැප්තැම්බර් 18-19 දක්වා බංග්ලාදේශයේ ඩකා හිදී පැවැත්වීමට යෝජනා කරන ලදී.

**ඇ) ශ්‍රී ලංකා වෙළඳ බිහිදොරෙහි (SLTIP) පියවරෙන් පියවර ක්‍රියාකාරීත්වය (SBSF)**

පියවරෙන් පියවර ක්‍රියාකාරීත්වය (SBSF) යනු වත්මන් ශ්‍රී ලංකා වෙළඳ බිහිදොරෙහි පරිශීලක සුහදත්වය වැඩිදියුණු කිරීම සඳහා වන අතිරේක ක්‍රියාකාරීත්වයකි. ඒ යටතේ අපනයන නිෂ්පාදන 49ක් සහ ආනයන නිෂ්පාදන 06ක් දැනටමත් සටහන් වී ඇති අතර, උනන්දුවක් දක්වන ව්‍යාපාරිකයින්ට අපනයන සහ ආනයන ක්‍රියා පටිපාටි පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සපයයි.

ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය සහ ජාතික වාණිජ හා කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ සැසියේදී ශ්‍රී ලංකා වෙළෙඳ බිහිදොරට (SLTIP) ඇතුළත් කර ඇති පියවරෙන් පියවර ක්‍රියාකාරීත්ව පිළිබඳව, වෙළඳ ක්‍රියා පටිපාටි සහ ඒවා ක්‍රියාත්මක වන ආකාරය සහ එහි ප්‍රතිලාභ වෙළඳ පාර්ශවකරුවන් සඳහා පියවරෙන් පියවර හඳුන්වා දෙන ලදී.

**ඇ) ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර (SLTIP)**

"Cyberia" යනු ලාඕ හි පිහිටි සමාගමකි, එය 2022 ජනවාරි මස අවසානය දක්වා ශ්‍රී ලංකා වෙළඳ බිහිදොර (SLTIP) පිළිබඳ සත්කාරකත්වය සහ නඩත්තු කටයුතු සිදු කර ඇත. SLTIP සත්කාරකත්වය සහ නඩත්තු කිරීම සඳහා දේශීය සමාගමක් බඳවා ගැනීම සඳහා ICTA සහාය ඇතිව දෙපාර්තමේන්තුව විසින් මිල ගණන් සඳහා තොරතුරු (IFQ) ලබා ගැනීම අවසන් කර ඇත. ලංසු තැබීමේ ක්‍රමය යටතේ සමාගම් 11කින් (ICTA විසින් සපයන ලද) මිල ගණන් කැඳවන ලදී. 2021.11.15 (වසරක කොන්ත්‍රාත්තුවක්) සිට ක්‍රියාත්මක වන පරිදි SLTIP නඩත්තු කිරීමට ලංසු ඉදිරිපත් කර තිබූ සමාගම් 03ක් අතරින් "Arimac Lanka Pvt Ltd" සමාගම දෙපාර්තමේන්තුව විසින් පත් කර ඇති අතර ICTA විසින් ලංකා රාජ්‍ය තොරතුරු ගබඩාව (Lanka Government Cloud -LGC) හි සත්කාරකත්වය නොමිලේ සපයයි. ඉන්පසු Arimac Lanka Pvt Ltd තවත් වසරක සේවා කාලයක් අනුපූරක පදනම මත 2023.12.31 දක්වා දීර්ඝ කළේය.පසුව, දත්ත සංක්‍රමණ ක්‍රියාකාරකම් (පෙර සේවාදායක සිට LGC වෙත) සහ SLTIP පරිපාලක වෙබ් අඩවිය පිළිබඳ පුහුණුව "Cyberia" සමාගම විසින් සිදු කරන ලදී. දෙපාර්තමේන්තුව විසින් පාර්ශවකරුවන්ගේ නියෝජිතායතන 42ක් සමඟින් SLTIP යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරයි.

**ඉ) වෙළඳ වාර්තා සකස් කිරීම**

සමාලෝචිත කාල සීමාව තුළ විවිධ බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීම මත පාර්ශ්වික වෙළඳාම පිළිබඳ වෙළඳ සාරාංශ/වාර්තා 250ක් පමණ විස්තීර්ණ හා ඒකාබද්ධ අයුරින් සකස් කර/යාවත්කාලීන කර ඇත.

## IV. වෙළඳ ප්‍රවර්ධන අංශය

**අ) වෙළඳ විමසුම් පිළිබඳ කටයුතු කිරීම**

වාණිජ නිලධාරීන්ට වෙළඳ විමසීම් 481ක් ලැබී ඇති අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශ වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කිරීමේ අරමුණින් අවශ්‍ය තොරතුරු/මාර්ගෝපදේශ ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගෙන් සහ අනෙකුත් වෙළෙඳාම සම්බන්ධ ආයතනවලින් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු විමසීම් 45ක් පසු විපරම් සඳහා වාණිජ නිලධාරීන් වෙත යොමු කරන ලදී.

**ආ) වෙළඳ ආරවුල් විසඳීම සඳහා සහයෝගය ලබා දීම**

අපනයනය සහ ආනයනය සම්බන්ධ ආරවුල් සාමකාමී අයුරින් විසඳා ගැනීම පිණිස ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන්ගේ නිරීක්ෂණ ඉල්ලමින් පැමිණිලි 45 ක් ඉදිරිපත් විය. මතභේදයට තුඩු දී ඇති පාර්ශ්වයන් අතර සාමකාමී විසඳුමක් හරහා අපනයන හා ආනයන ආශ්‍රිත වෙළඳ ආරවුල් විසඳීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. සමාලෝචිත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩල විසින් එවැනි පැමිණිලි 57 ක් ගනුදෙනු කර ඇති අතර දෙපාර්තමේන්තුව වෙත සෘජුවම ලැබුණු පැමිණිලි 28 ක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

**ඇ) නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම**

වෙළඳ හා සේවා අංශවල විදේශිකයන් 57 දෙනෙකු සහ යැපෙන්නන් 30 දෙනෙකු සමාලෝචනය කිරීමෙන් අනතුරුව නේවාසික වීසා නිර්දේශ ලිපි නිකුත් කරන ලදී.

**ඇ) ඉන්දියාව සමඟ නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ ඇඟලුම් නිෂ්පාදන සඳහා නිකුත් කරන ලද තීරුබදු අනුපාත කෝටා සහතික**

කොටස් මිලියන 6.8 ක් සඳහා තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) 2,195 නිකුත් කරන ලදී.

**ඉ) 1949 උකස් පනත යටතේ ණය දෙන ආයතන අනුමත කිරීම**

උකස් පනතේ 114(i) වගන්තිය යටතේ ඇති බලතල අනුව වෙළඳ අමාත්‍යවරයා විසින් "අනුමත ණය නියෝජිතායතන" ලෙස ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සඳහා ණය නියෝජිතායතන වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ කිරීම සඳහා සාමාජිකයින් 3 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට නියමිතය.

**ඊ) පාකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් ගිවිසුම යටතේ බාස්මතී සහල් කෝටාව සඳහා තීරුබදු අත්හැරීමේ නිර්දේශ ලිපි නිකුත් කිරීම**

පාකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් ගිවිසුම යටතේ බාස්මතී සහල් මෙට්‍රික් ටොන් 966ක් ආනයනය කිරීමට තීරුබදු නිදහස් කිරීමේ නිර්දේශ ලිපි 24ක් නිකුත් කෙරේ.

**උ) වෙළඳ ප්‍රදර්ශන/ ප්‍රදර්ශන/ උත්සව සංවිධානය**

i. වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද *8* වැනි චීන-දකුණු ආසියානු ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා නියෝජිත පිරිස සංවිධානය කරන ලද අතර, එයට සමාගම් *106* ක් ඇතුළත් වූ අතර එහි ප්‍රධානියා වූයේ අමාත්‍යාංශ ලේකම්වරයා විසිනි.

ii. වාණිජ දෙපාර්තමේන්තුව විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ අපනයනකරුවන් සඳහා දීප ව්‍යාප්ත දැනුවත් කිරීමේ සැසි සංවිධානය කර ඇති අතර 'Trade Up Sri Lanka' යන නව තේමාවක් හඳුන්වා දී ඇත. රාජ්‍ය සහ පෞද්ගලික ව්‍යාපාර සහය ආයතන 45ක සහය ඇතිව සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ව්‍යාපාර 400කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් 2024 ජුනි 26 වැනි දින මාතර දිස්ත්‍රික්කයේ සමාරම්භක උත්සවය පැවැත්විණි.

උ෴) විදේශ වාණිජ නියෝජනය

මෙම කාලසීමාව තුළ විදේශගතව සිටින වාණිජ නිලධාරීන් විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශය පහත වගුවේ දක්වා ඇත.

*වගු අංකය 3. 3 විදේශගතව සිටින වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම්*

| අනු අංකය | වාණිජ නිලධාරීන්ගේ කාර්යයන් | සමස්ත ක්‍රියාකාරකම් සංඛ්‍යාව **2024.01.01** සිට **2024.11.30** දක්වා |
|---|---|---|
| 1 | ව්‍යාපාර ගැලපීම් පැවැත්වීම (B2B රැස්වීම) | 1122 |
| 2 | ව්‍යාපාර ජාල සැසිවාර පැවැත්වීම | 89 |
| 3 | වෙනත් රටවල ශ්‍රී ලාංකික වෙළඳාම ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (ව්‍යාපාරික සම්මේලන, සම්මන්ත්‍රණ ආදිය) | 70 |
| 4 | වෙනත් රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය | 52 |
| 5 | ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රදර්ශන/ වෙලඳ සල්පිල් වෙත අභ්‍යන්තර ගැනුම් මෙහෙයුම් සහභාගීත්ව සංවිධානය | 32 |
| 6 | රජයේ අමාත්‍යවරුන් සහ අනෙකුත් ප්‍රභූවරුන් ඇතුළු ශ්‍රී ලංකාවෙන් සත්කාරක රට වෙත වෙළඳ නියෝජිතයින්ගේ සංචාරය සංවිධානය කිරීම | 58 |
| 7 | වෙළඳ ආරවුල්/ පැමිණිලි විසඳීමට කටයුතු කිරීම | 57 |
| 8 | අපනයන වෙළඳ විමසුම් වෙනුවෙන් කටයුතු කිරීම | 481 |
| 9 | වෙළඳපොළ තොරතුරු සහ වෙළඳපල ප්‍රවේශ වාර්තා සැපයීම | 92 |
| 10 | ශ්‍රී ලාංකීය ප්‍රදර්ශන සත්කාරක/ බලයලත් රට තුළ ප්‍රවර්ධනය කිරීම | 121 |
| 11 | විභවීය ව්‍යාපාරික පාර්ශවකරුවන් සහ වෙළඳ මණ්ඩල හමුවීම් පැවැත්වීම | 508 |
| 12 | වෙළඳපොළ ප්‍රවේශය පිළිබඳ කාරණා සඳහා මැදිහත් වීම, සත්කාරක රටේ බලධාරීන් සමඟ සම්බන්ධ වීම සහ වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳව සත්කාරක රජය සමඟ සම්බන්ධ වීම | 98 |
| 13 | වෙනත් වෙළඳාම ආශ්‍රිත ක්‍රියාකාරකම් (උදා- ශ්‍රී ලංකාව සහ විදේශය යන දෙකටම අදාළ ටෙන්ඩර් ප්‍රචාරණය/යෝජනා (RFP) සඳහා ඉල්ලීම) | 867 |
| 14 | ආයෝජන පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීම | 35 |
| 15 | ආයෝජන යෝජනාවන් පිළිබඳ කටයුතු කිරීම | 78 |
| 16 | අයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම. | 37 |
| 17 | වෙනත් ආයෝජන ආශ්‍රිත ක්‍රියාකාරකම් (උදා- ආයෝජන විමසීම් ආදියට සහභාගී වීම) | 80 |
| 18 | ප්‍රචාරණය සහ ප්‍රවර්ධන ව්‍යාපාර සැලසුම් කිරීම/ චාරිකා සංවිධානය කිරීම ඇතුළු සංචාරක ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම/ පහසුකම් සැලසීම | 234 |
| 19 | වෙනත් රටවල පැවැත්වෙන සංචාරක ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම/ පහසුකරණය | 30 |
| 20 | වෙනත් සංචාරක ආශ්‍රිත ක්‍රියාකාරකම් (උදා- සංචාරක විමසීම් ආදිය) | 463 |
| 21 | ඒකාබද්ධ කොමිෂන් සභා/වෙළඳ සහ ආයෝජන රාමු ගිවිසුම (TIFAs) සම්බන්ධීකරණය | 11 |
| 22 | ක්‍රියාකාරී කණ්ඩායම් සම්බන්ධීකරණය | 6 |
| 23 | වෙනත් ආශ්‍රිත ක්‍රියාකාරකම් (නිල සංවර්ධන ආධාර) | 26 |
| 24 | WTO/EU/FAO/IFAD/WFP/UNCTAD, ආදියෙහි ශ්‍රී ලංකාවේ නියෝජනය පිළිබඳ ක්‍රියාකාරකම් | 63 |

මූලාශ්‍රය : වාණිජ දෙපාර්තමේන්තුව

## V. ප්‍රභවස්ථාන නීති අංශය

### අ) ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම (COOs) සහ අනෙකුත් උපකාරක සේවා

ප්‍රභවස්ථාන නීති අංශය විසින් සපයනු ලබන ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සහ අනෙකුත් උපකාරක සේවාවන් සඳහා වන සංඛ්‍යා දත්ත පහත පරිදි වේ.

*වගු අංකය 3. 4 ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම සහ අනෙකුත් උපකාරක සේවාවන්*

| අනු අංකය | කාර්යය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික | 27,670 |
| 02 | ISFTA යටතේ කෝටා වෙන් කිරීම | 2,745 |
| 03 | වරණීය යෝජනා ක්‍රම යටතේ නව ලියාපදිංචිය | 170 |
| 04 | EU-REX ලියාපදිංචිය | 51 |
| 05 | පිරිවැය ප්‍රකාශ සඳහා අනුමැතිය | 6,544 |
| 06 | දිවුරුම් ප්‍රකාශ | 1,950 |
| 07 | සත්‍යාපනය කිරීම් | 356 |
| 08 | අපනයනකරුවන්ට විස්තර කිරීම/පැහැදිලි කිරීම | 11,500 |
| 09 | වැඩ කල දින ගණන | 240 |
| 10 | නිකුත් කරන ලද COO හි දෛනික සාමාන්‍යය | 165 |

මූලාශ්‍රය : වාණිජ දෙපාර්තමේන්තුව

### ආ) ප්‍රභවස්ථාන සහතිකපත් නිකුත්කිරීමේ මාර්ගගත පද්ධතිය

DOC, ITC සහ GIZ හි තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇතිව, COOs ඉලෙක්ට්‍රොනික නිකුත් කිරීම සඳහා දැනට පවතින ECOO පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර, පද්ධතියේ වත්මන් හිඩැස් විසඳීම සහ නව විශේෂාංග එකතු කිරීම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය COVID-19 වසංගතයේ සන්දර්භය තුළ දියත් කරන ලද අතර, අපනයනකරුවන් මුහුණ දෙන අභියෝගවලට විසඳුම් සෙවීමත් , COOs සහ අනෙකුත් උපකාරක සේවා සැපයීම විධිමත් කිරීම සහ කඩිනම් කිරීම පද්ධතිය මගින් අපේක්ෂා කරනු ලැබේ.

2024වසර අවසානයේදී ITC සහ DoC ව්‍යාපෘතිය යටතේ පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත:

i. කොමර්ෂල් බැංකුව, මහජන බැංකුව, පැන් ඒෂියා බැංකුව සහ කාගිල්ස් බැංකුව සමඟ වින්‍යාසගත LPOP පහසුකම, අපනයනකරුවන්ට ECOO සඳහා වැඩි දියුණු කළ මාර්ගගත ගෙවීම් පහසුකමක් අත්විඳීමට හැකියාව ලබා දෙයි.

ii. සේවාදායක අවශ්‍යතා ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ බෙදා ගන්නා ලද අතර ලංකා රජයේ ක්ලවුඩ් මත ICTA විසින් සේවාදායක අවකාශය වෙන් කරන ලදී.

iii. මෘදුකාංග සංවර්ධන සමාගම සජීවී පද්ධතියේ අවශ්‍ය වර්ධනයන් සහ වින්‍යාස කිරීම් සිදු කරන ලදී. වැනි, වානිජ දෙපාර්තමේන්තුව සමඟ එක්ව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DEA) විසින් හඳුන්වා දෙන ලද කෝටා ක්‍රමයක් යටතේ පුවක් අපනයනකරුවන් සඳහා නව යාන්ත්‍රණයක් සකස් කිරීම සහ DEA සමඟ විද්‍යුත් පහසුකම අන්තර් සම්බන්ධිත කිරීම. දැන් DEA හට වාර්ෂික පුවක් කෝටාව අධීක්ෂණය සහ යාවත්කාලීන කිරීම සඳහා ECOO පද්ධතියට ප්‍රවේශ විය හැක.

iv. පවතින සහ නව අපනයනකරුවන් සඳහා ECOO පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා වසර පුරා දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

v. DoC සමාගම් ලියාපදිංචිය, සමාලෝචන ක්‍රියාවලිය, CoOs අනුමත කිරීම සහ නිකුත් කිරීම පිළිබඳ පුහුණුව සහ පිරිවැය ප්‍රකාශ/ දිවුරුම් ප්‍රකාශ සමාලෝචනය අවසන් කරන ලදී.

vi. 2024 වසර අවසානයේදී, ISFTA, SAFTA, SAPTA සහ APTA ගිවිසුම් යටතේ ECOO නිකුත් කිරීම 93% කාලය ඉතිරි කිරීම සහ කඩදාසි රහිත පරිසරය වැඩිදියුණු කිරීම සමඟ සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කරන ලදී.

## VI. ආදායම් උත්පාදන වැඩසටහන් සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය

*වගු අංකය 3. 5 ආදායම් උත්පාදන වැඩසටහන් සහ ව්‍යාපෘති වල ප්‍රගතිය*

| ක්‍රියාකාරකම් | අපේක්ෂිත ආදායම සහ භෞතික ඉලක්කය | | 2024.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | මූල්‍ය (රු. මි.) | භෞතික | මූල්‍ය (රු. මි.) | භෞතික |
| නිදහස් වෙළඳ ගිවිසුම්, කලාපීය වෙළඳ ගිවිසුම් සහ GSP යෝජනා ක්‍රම යටතේ අපනයන සමාගම් ලියාපදිංචි කිරීම | 2,160,000.00 | සමාගම් 150 | 550,000.00 | සමාගම් 170 ක් ලියාපදිංචි කර ඇත |
| ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්, කලාපීය වෙළඳ ගිවිසුම් සහ වරණීය යෝජනා ක්‍රම යටතේ ප්‍රභවස්ථාන සහතිකපත් (COOs) නිකුත් කිරීම | 39,750,000.00 | සහතිකපත් 26,000 | 41,505,000 | සහතිකපත් 27,670 ක් නිකුත් කර ඇත |
| ඉන්දියාව සමඟ නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ ඇඟලුම් නිෂ්පාදන සඳහා නිකුත් කරන ලද තීරුබදු අනුපාත කෝටා සහතික | 1,450,000.00 | 2700 තීරුබදු අනුපාත කෝටා සහතික | 2,088,000.00 | සහතිකපත් 2784 ක් නිකුත් කර ඇත |
| නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම | 3,210,800.00 | අනුමත නේවාසික වීසා ගණන: ලැබුණු අයදුම්පත් අනුව | 1,572,050.00 | අයදුම්කරුවන් 59ක් සහ යැපෙන්නන් 30ක් සඳහා නේවාසික වීසා නිර්දේශ නිකුත් කර ඇත |

මූලාශ්‍රය : වාණිජ දෙපාර්තමේන්තුව

### 3.3. සීමාසහිත ලංකා සතොස සමාගම


**i. ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි ප්‍රගතිය**

2024 වර්ෂයේ ලංකා සතොස සමාගම රු.බි.47.4 ක පිරිවැටුමක් (ජනවාරි-නොවැම්බර් දක්වා) වාර්ථා කිරිමට සමත්ව ඇති අතර රු.බි. 3 ක් වූ දිගු කාලීන ණය මුදල වසර තුළදී සම්පූර්ණයෙන්ම පියවීමට කටයුතු කොට ඇත.

වසරේ මාසික අලෙවි ආදායම (බදු ඇතුලත්ව) පහත පරිදි වේ.

*වගු අංකය 3. 6 මෙහෙයුම් ක්‍රියාකාරකම්හි ප්‍රගතිය*

| මාසය | මාසික පිරිවැටුම (රු.මි.) |
|---|---|
| ජනවාරි | 4,623 |
| පෙබරවාරි | 4,713 |
| මාර්තු | 5,327 |
| අප්‍රේල් | 6,588 |
| මැයි | 4,210 |
| ජූනි | 4,225 |
| ජූලි | 4,447 |
| අගෝස්තු | 4,689 |
| සැප්තැම්බර් | 4,652 |
| ඔක්තොම්බර් | 4,518 |
| නොවැම්බර් | 4,411 |
| දෙසැම්බර් | 5,741 |
| **එකතුව** | **58,146** |




මූලාශ්‍රය : සීමාසහිත ලංකා සතොස සමාගම

**ii. ප්‍රවාහන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම**

භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම තුළින් පිරිවැය අවම කර ගැනීම උදෙසා ප්‍රවාහන කළමණාකරන පද්ධතියක් ස්ථාපිත කොට ඇත.

**iii. අමතර ආදායම් වර්ධනය**

2023 වසරට සාපෙක්ෂව 2024 වසරේ අතුරු බදු ආදායම 100% වර්ධනය කිරීමට හැකිව ඇත. නව අතුරු බදු ආදායම් අවස්ථා හඳුනා ගැනීම සහ දැනට ලබා දී ඇති අතුරු බදු ගිවිසුම් දීර්ඝ කිරිම තුළින් මෙම ආදායම් වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇත.

**iv. ණය පියවීම සහ ණය පොලී වියදම් අඩු කිරීම**

භාණ්ඩාගාර ඇපකරයක් මත මහජන බැංකුවෙන් ලබාගෙන තිබු රු.බි. 3 ක ණය මුදල 2024 වසරේදී සම්පූර්ණයෙන්ම පියවීමට හැකි වූ අතර, ණය මුදල අඩුවීම සහ ණය පොලී අනුපාතිකය අඩුවීම හේතු කොට ගෙන 2023 වසරට සාපේක්ෂව ණය පොලිය 100% කින් අඩු කිරීමට හැකියාව ලැබී ඇත. 2020 වසරේ සිට 2024 දක්වා කාලය තුළදී අදාළ ණය ගෙවීම් පැහැර හැරීමකින් තොරව නියමිත කාලයට ගෙවීම තුළින් මෙම ණය මුදල් සම්පූර්ණයෙන්ම පියවීමට හැකියාව ලැබී ඇත.

**v. නව අලෙවිසැල් විවෘත කිරීම.**

2024 වසර තුළදී නව අලෙවිසැල් 06 ක් ( අලදෙණිය, දියතලාව, දොම්පෙ, කිරින්ද, කඳපොල, සේරුනුවර) විවෘත කොට ඇත.

**vi. අලෙවිසැල් නවීකරණය**

ලංකා සතොස සමාගම රු.මිලියන 148 ක පිරිවැයක් දරා කළුතර දකුණ, කැකිරාව, ලුණුගල,කටුනායක - 01, අනුරාධපුර - 01 , මාරවිල, බදුල්ල, තල්ගස්වල, ගම්පහ - 02 සහ කළුතර - 01 යන අලෙවිසැල් නවීකරණය කිරීමට පියවර ගෙන ඇත.

## 3.4. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

### i. 2024 ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු (විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතන)

*වගු අංකය 3. 7 2024 ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු*

| මාසය | විශ්ව විද්‍යාල සඳහා රු.5,000 ශිෂ්‍යත්වය ලබන සිසුන් ගණන | අනෙකුත් ආයතන සඳහා රු.2,500 ශිෂ්‍යත්වය ලබන සිසුන් ගණන | මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.) | භාණ්ඩාගාරයේ දායකත්වය (රු.) | මාසිකව මහපොළ ශිෂ්‍යත්ව සඳහා ගෙවනු ලබන මුළු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 19,137 | 3,970 | 59,864,800.00 | 47,211,500.00 | 107,076,300.00 |
| පෙබරවාරි | 38,122 | 580 | 146,713,000.00 | 138,915,000.00 | 285,628,000.00 |
| මාර්තු | 37,477 | 3,568 | 110,392,088.00 | 93,594,900.00 | 203,986,988.00 |
| අප්‍රේල් | 20,228 | 3,472 | 63,442,500.00 | 50,685,600.00 | 114,128,100.00 |
| මැයි | 23,781 | 3,358 | 62,417,950.00 | 59,843,700.00 | 122,261,650.00 |
| ජුනි | 29,695 | 3,434 | 103,726,150.00 | 88,792,900.00 | 192,519,050.00 |
| 1-10 වාරික (2021-22) | 14,537 | - | 352,869,200.00 | 338,313,150.00 | 691,182,350.00 |
| ජූලි | 41,327 | 753 | 178,839,850.00 | 169,167,600.00 | 348,007,450.00 |
| අගෝස්තු | 25,422 | 515 | 75,233,050.00 | 70,373,800.00 | 145,606,850.00 |
| සැප්තැම්බර් | 39,562 | 2,489 | 153,352,250.00 | 136,602,200.00 | 289,954,450.00 |
| ඔක්තෝම්බර් | 42,712 | 2,310 | 144,081,750.00 | 129,271,800.00 | 273,353,550.00 |
| **එකතුව** | **332,000** | **24,449** | **1,450,932,588.00** | **1,322,772,150.00** | **2,773,704,738.00** |

මූලාශ්‍රය : ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

## ii. සමස්ත ශිෂ්‍යත්ව ප්‍රදානය 2018 සිට මේ දක්වා

*වගු අංකය 3. 8 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය පිළිබඳ තොරතුරු*

| සිසුන් ඇතුළත් කරගැනීම | 2018/19 | 2019/20 | 2020/21 | 2021/22 | 2022/23 | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල සිසුන් | 30830 | 40111 | 41893 | 41607 | 42147 | 196,588 |
| උසස් අධ්‍යාපන තාක්ෂණ ආයතන සිසුන් | 1500 | 1500 | 1500 | - | - | 4,500 |
| අනෙකුත් ආයතන සිසුන් | 299 | 294 | 343 | 46 | - | 982 |
| **එකතුව** | **32,629** | **41,905** | **43,736** | **41,653** | **42,147** | **202,070** |

මූලාශ්‍රය : ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

## iii. විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම

*වගු අංකය 3. 9 විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම*

| වර්ෂය | 17/18 | 18/19 | 19/20 | 20/21 | 21/22 | 22/23 |
|---|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 30141 | 30830 | 40111 | 41893 | 41607 | 42147 |
| ආදායම් සීමාව ( රු.ලක්ෂ 5 ට අඩු) අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 13461 | 13456 | 14227 | 14255 | 14213 | 15084 |
| මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | 14961 | 14957 | 15827 | 15855 | 15815 | 16785 |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 45% | 44% | 36% | 34% | 34% | 36% |
| මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 50% | 49% | 40% | 38% | 38% | 40% |

මූලාශ්‍රය : ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

## 3.5. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් ප්‍රතීතනය ලබා ගත් ආයතන විසින් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා හා සහතික සඳහා අන්තර්ජාතික පිළි ගැනීම තහවුරු කිරීම සඳහා අප ආයතනය මෙම අන්තර්ජාතික ප්‍රතීතන සංවිධානවල සාමාජිකත්වය පවත්වාගෙනයාම හා ක්‍රියාකාරී දායකත්වය ලබාදීම අනිවාර්ය වේ. මේ තුළින් IAF හා ILAC අන්‍යෝන්‍ය පිළිගැනීම යටතේ ප්‍රතීතනය ලබා දීම් පහත දැක්වේ.

### i. ප්‍රතීතන ලබා දීම

*වගු අංකය 3. 10 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන ලබා දීම*

| විෂය පථය | දෙවන පෙළ | තෙවන පෙළ | ලබා දී ඇති ප්‍රතීතන සංඛ්‍යාව |
|---|---|---|---|
| IAF අන්‍යෝන්‍ය පිළිගැනීම | භාණ්ඩ සහතික කිරීම. | ISO/IEC 17065 | 13 |
| | වලංගු කිරීම් හා සහතික කිරීමේ ආයතන | ISO/IEC 17029 | 04 |
| | කළමනාකරණ පද්ධති සහතිකකරණය පිළිබඳ ප්‍රතීතන ප්‍රදානයන් | ISO/IEC 17021-1 | |
| | ආහාර සුරක්ෂිතතා කළමණාකරණ පද්ධති | ISO/IEC22000 (FSMS) | 05 |
| | තත්ත්ව කළමණාකරණ පද්ධති සහතික කිරීම. | ISO 9001 (QMS) | 05 |
| | පාරිසරික කළමණාකරණ පද්ධති සහතික කිරීම. | ISO 14001 (EMS) | 04 |
| | Occupational Health and Safety Management System | ISO 4501 (OHSMS) | 03 |
| | Energy management System | ISO 50001 (EnMs) | 01 |
| ILAC අන්‍යෝන්‍ය පිළිගැනීම | පරීක්ෂා කිරීමේ රසායනාගාර | ISO/IEC 17025 | 124 |
| | වෛද්‍ය රසායානාගාර | ISO 15189 | 26 |
| | ක්‍රමාංකන පරීක්ෂණාගාර | ISO/IEC 17025 | 17 |
| | පිරික්සුම් ආයතන | ISO/IEC 17020 | 11 |
| | නිපුනතා පරීක්ෂණ සපයන ආයතන | ISO/IEC 17043 | 04 |

මූලාශ්‍රය : අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## ii. 2024.01.01 වන දින සිට 2024.12.31 වන දින දක්වා ලබා දී ඇති නව ප්‍රතීතනයන්

*වගු අංකය 3. 11 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2024 වසරේදී ලබා දී ඇති නව ප්‍රතීතනයන්*

| අංකය | ආයතනයේ නම | විෂය පථය |
|---|---|---|
| | **වෛද්‍ය රසායනාගාර** | |
| 01 | යුධ හමුදා රෝහල | ව්‍යාධිවේදය, සෛල විද්‍යාව |
| 02 | ආසිරි රසායනාගාය, ආසිරි රෝහල-මාතර | සායනික ජෛව රසායනය/රසායනික ව්‍යාධිවේදය, රක්තවේදය සහ සායනික ව්‍යාධිවේදය |
| 03 | හේමාස් රෝහල් රසායනාගාර සේවාව-වත්තල | සායනික ජෛව රසායනය/රසායනික ව්‍යාධිවේදය, රක්තවේදය සහ සායනික ව්‍යාධිවේදය, ක්ෂුද්‍රජීව විද්‍යාව |
| | **පරික්ෂා කිරීමේ රසායනාගාර හා ක්‍රමාංකනාගාර** | |
| 04 | GSSITM | උෂ්ණත්ව ක්‍රමාංකනය |
| 05 | ටෙක්ස්ලාන් රසායනාගාරය | රසායනික පරීක්ෂණ- නූල් සහ මේස් |
| 06 | ජාතික පසු අස්වනු කළමණාකරන ආයතනය | ආහාර හා ධාන්‍ය නිෂ්පාදන පිළිබඳ රසායනික හා යාන්ත්‍රික පරීක්ෂණ |
| 07 | බැසිලර් තේ අපනයන පුද්ගලික සමාගම | තේ පිළිබඳ රසායනික හා යාන්ත්‍රික පරීක්ෂණ |
| 08 | සිලෝන් ග්‍රීන් එලිවේටර්ස් | කුකුල් මස් සඳහා ක්ෂුද්‍රජීව විද්‍යා පරික්ෂණ |
| 09 | ප්‍රෙසිෂන් තාක්ෂණික ජාත්‍යන්තර(පුද්.) සමාගම | යාන්ත්‍රික, උෂ්ණත්ව, ප්‍රකාශ, කාලය හා සංඛ්‍යානය |
| 10 | පුස්වැල්ලාව මාංශ නිෂ්පාදන පුදගලික සමාගම | මාංශ හා සත්ව ආහාර අමුද්‍රව්‍ය පිළිබඳ ජීව විද්‍යාත්මක පරීක්ෂණ |
| 11 | කාර්මික තාක්ෂණ ආයතනය | පෙට්‍රල් ආශ්‍රිත නිෂ්පාදන හා ලිහිසිකාරක පිළිබඳ රසායනික පරීක්ෂණ |
| 12 | බියුරෝ වෙරිටාස් පාරිභෝගික සේවා නිෂ්පාදන පුද්ගලික සමාගම | ධ්වනි හා යාන්ත්‍රික පරීක්ෂණ |
| 13 | නවෙස්ටා ෆාමසි පුද්ගලික සමාගම | ෆාමසි නිෂ්පාදන පිළිබඳ රසායනික පරීක්ෂණ |
| 14 | ජල සම්පත් මණ්ඩලය | ජලය සම්බන්ධ රසායනික පරීක්ෂණ |
| 15 | බියුරෝ වෙරිටාස් පාරිභෝගික සේවා නිෂ්පාදන පුද්ගලික සමාගම | සීමාකළරන ලද ද්‍රව්‍ය පරික්ෂාව |
| 16 | ජාතික ජල සම්පත් හා ජලප්‍රවාහන මණ්ඩලය | ජලය සම්බන්ධ රසායනික පරීක්ෂණ ක්ෂුද්‍රජීව විද්‍යා පරික්ෂණ |
| 17 | සයන්ටිෆික් ක්‍රමාංකන මධ්‍යස්ථානය | ක්‍රමාංකන හා ඒ ආශ්‍රිත කටයුතු |

| | | |
|---|---|---|
| **පිරික්සුම් ආයතන** | | |
| 18 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | නායයෑම් අවදානම් තක්සේරුව |
| 19 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | ආනයන හා අපනයන පරික්ෂාවන් |
| 20 | ටී.සී.අයි.එස් පරීක්ෂණ ලංකා පුද්ගලික ආයතනය | අපනයන පරික්ෂාවන් |
| 21 | බියුරෝ වෙරිටාස් පාරිභෝගික සේවා නිෂ්පාදන පුද්ගලික සමාගම | අපනයන පරික්ෂාවන් |
| **නිෂ්පාදන සහතිකකරණ ආයතන** | | |
| 22 | ඒ.ටී.සී ජාත්‍යන්තර පුද්ගලික සමාගම | වෑද්දුම් නිෂ්පාදන හා ලෝහ නිෂ්පාදන |
| 23 | ඉන්ඩෙක්ස්පෝ සහතිකකිරීමේ ආයතනය | යහපත් නිෂ්පාදන පුරුදු හා ආහාර සැපයීම |
| 24 | නැෂනල් ක්ලීනර් ප්‍රඩක්ෂන් සෙන්ටර් | පාරිසරික ලේබල |
| **පද්ධති සහතිකකිරීමේ ආයතන** | | |
| 25 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | වෘත්තීමය සෞඛ්‍ය හා ආරක්ෂණ කළමණාකරන පද්ධති(තොරතුරු තාක්ෂණ) |
| 26 | සීසර්ට් පුද්ගලික  සමාගම | ආරක්ෂණ ක්‍රමවේද-තොරතුරු තාක්ෂණ |
| 27 | ATC ජාත්‍යන්තර පුද්ගලික සමාගම | තත්ත්ව කළමණාකරන පද්ධති<br>පාරිසරික කළමණාකරන පද්ධති<br>වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය |
| **වලංගු කිරීමේ හා සත්‍යාපන ආයතන** | | |
| 28 | නැෂනල් ක්ලීනර් ප්‍රඩක්ෂන් සෙන්ටර් | ISO/IEC 17029:2019, ISO/IEC 14065:2020 |
| 29 | ඉකෝලාන්ස් පුද්ගලික සමාගම, ඉන්දියාව | ISO/IEC 17029:2019, ISO/IEC 14065:2020, ISO 14064-2:2019, හරිතාගාර වායු සංවිධාන සහ වලංගුකිරීමේ හා සත්‍යාපන ප්‍රතීතන යෝජනා ක්‍රමය ව්‍යාපෘති මට්ටම |
| 30 | | ISO/IEC 17029:2019 නිෂ්පාදන කාබන් පා සටහන්, GHG සම්බන්ධ ප්‍රකාශයන් සත්‍යාපනය කිරීම |
| **නිපුනතා පරීක්ෂණ ආයතන** | | |
| 31 | මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තුමේන්තුව | රසායනික පරීක්ෂණ පිළිබඳ නිපුනතා පරීක්ෂණ පැවැත්වීම |

මූලාශ්‍රය : අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

2024.01.01 දින සිට ඉපයූ ආදායම දේශීය මුදලින් රු. මි. 83 ක් හා විදේශීය අනුකූලතා තක්සේරු ආයතන මඟින් ඉපයූ ආදායම රු. මි. 73 ක් වේ.

## 3.6. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

### i. දේශීයව සිදු කළ කාර්යයන්හි ප්‍රගතිය

*වගු අංකය 3. 12 දේශීයව සිදු කළ කාර්යයන්හි ප්‍රගතිය*

| ආදායම් මාර්ග | | භෞතික ප්‍රගතිය | | ආදායම (රු.මි.) | |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ඉටුකල ප්‍රමාණය | ඉලක්ක | සත්‍ය ආදායම |
| අංක ශෝධනය | | | | | |
| 01 | ජාතික මිනුම් පර්යේෂණාගාරය මඟින් සිදුකරනු ලැබූ අංකශෝධන ප්‍රමාණයන් | 1,375 | 1,313 | 4.125 | 6.95 |
| | අභ්‍යන්තර අංකශෝධනය සඳහා ගිණුම්ගත නොවන නාමික ආදායම | | 79 | | **0.**63 |
| ලියාපදිංචි සහතික නිකුත් කිරීම | | | | | |
| 02 | ලියාපදිංචි සහතික නිකුත්කල ප්‍රමාණය (අලුත්වැඩියා කිරීම, ආනයනය කර විකිණීම, නිෂ්පාදනය කර විකිණීම සහ විකිණීම) | 479 | 465 | 1.38 | 1.58 |
| | පවත්වන ලද විභාග සංඛ්‍යාව | | 8 | | |
| මාදිලි අනුමැතිය | | | | | |
| 03 | මාදිලි අනුමැතිය ලබාදුන් ප්‍රමාණය | 37 | 52 | 0.46 | 1.28 |
| සත්‍යායන වැඩසටහන් | | | | | |
| 04 | සත්‍යායනය කරන ලද කිරුම් හා මිනුම් උපකරණ ප්‍රමාණය (ප්‍රධාන කාර්යාලය) | 550,000 | 42,257 | 403.33 | 73.89 |
| | සත්‍යායනය කරන ලද කිරුම් හා මිනුම් උපකරණ ප්‍රමාණය (දිස්ත්‍රික් කාර්යාල ) | | 344,642 | | 278.47 |
| වැටලීම් | | | | | |
| 05 | වැටලීම් කරන ලද ප්‍රමාණය | 12,631 | 36,779 | - | - |
| 06 | සිදුකරන ලද දැනුවත් කිරීම් වැඩසටහන් ප්‍රමාණය | 821 | 11,496 | - | - |
| 07 | සිදු කරන ලද පෙර ඇසුරුම් සංඛ්‍යාව | 8,250 | 2,865 | - | - |
| පුහුණු වැඩසටහන් | | | | | |
| 08 | සිදු කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව(සැලසුම් කරන ලද) | 7 | 5 | 0.92 | 2.55 |
| | සිදු කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව(ඉල්ලීම් කරන ලද ) | | 5 | | |

මූලාශ්‍රය : මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තු

**ii. ජාත්‍යන්තර සබඳතා මගින් සිදුකළ කාර්ය ප්‍රගතිය**

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව විද්‍යාත්මක මිනුම් විද්‍යා කාර්යයන්ට අදාළව ලෝකයේ ප්‍රමුඛතම ආයතනය වන කිරුම් හා මිනුම් පිළිබඳ මහා සම්මේලනයේ ( BIPM) ආශ්‍රිය සාමාජිකත්වය දරනු ලබන අතර, නෛතික මිනුම් විද්‍යාවට අදාලව මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (OIML ) පූර්ණ සාමාජිකත්වය දරනු ලබයි. තවද, මිනුම් විද්‍යාව සම්බන්ධයෙන් කලාපීය සංවිධානයක් වන ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ (APMP) පූර්ණ සාමාජිකත්වය දරනු ලබන අතර, එහි සංවර්ධනය වෙමින් පවතින කමිටුවේ (DEC- Developing Economies Committees) සභාපති ධූරය 2024 වර්ෂයට අදාලව දෙවන වසරටත් ශ්‍රී ලංකාවේ මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත . ඊට අමතරව එහි පිහිටුවා ඇති මෙහෙයුම් බලකා (task force) සඳහා මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක සේවයේ විධායක නිළධාරීන් ප්‍රමුඛ දායකත්වයක් ලබා දෙනු ලබයි.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මේ වන විට පහත දැක්වෙන ව්‍යාපෘති වලට අදාළව කටයුතු කරනු ලබයි.

**අ) එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ව්‍යාපෘති (UNIDO)**

කෘෂි ආහාර අංශයේ සංවර්ධනය සඳහා ප්‍රමිති මත පදනම් වූ ප්‍රමුඛ භාවිතයන් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපෘතිය.

Mainstreaming Standard based best practices for Agri – Food sector development project (BESP).

UNIDO සංවිධානයේ නව ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක වන අතර, එමගින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ගුණාත්මක යටිතල පහසුකම් සපයමින් කටයුතු කරයි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන හවුල්කරුවකු ලෙසට කටයුතු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් පුහුණු, උපදේශන සේවා, මිනුම් සංවර්ධනයට හා විදේශ ආධාර ලෙස ජාතික මිනුම් විද්‍යාගාරය සඳහා උපකරණ ලබා දෙනු ලැබේ.

**ආ) ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සක්‍රිය කිරීම සඳහා මිනුම් විද්‍යාව යොදා ගැනීමේ ආසියානු පැසිෆික් කලාපීය ව්‍යාපෘතිය.**

Metrology – Enabling Developing Economies in Asia (MEDEA)

PTB (ජර්මානු ජාතික මිනුම් විද්‍යා ආයතනය) ව්‍යාපෘතියක් ලෙස ආසියාවේ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සක්‍රිය කිරීම සඳහා MEDEA 3 ව්‍යාපෘතිය 2021 මැයි මාසයේදී ආරම්භ වූ අතර, එය 2025 වසර දක්වා පවතිනු ඇත. මෙම ව්‍යාපෘතිය ඉලක්කගත ආර්ථිකයන්හි එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා සහය දැක්වීම අරමුණු කර ඇති අතර, මෙම ව්‍යාපෘතිය මගින් මිනුම් විද්‍යාවේ විවිධ ක්ෂේත්‍රවල අදාල ධාරිතා ගොඩනැගීමට අදාළ ක්‍රියාකාරකම් හා පුහුණු කටයුතු සඳහා දායකත්වය ලබාදේ.

ආසියා පැසිෆික් මිනුම් විද්‍යා වැඩසටහනේ සංවර්ධනය වෙමින් පවතින රටවල කමිටුව (APMP-DEC) ඔස්සේ මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් මේවන විට සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යාගාරය සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගැනීම තුළින් ඉහළ ගුණාත්මක සේවාවක් ලබා දීම.

2023 දෙසැම්බර් 28 සිට මේ දක්වා දිග පිළිබඳ පරාමිතීන් තුනකට (gauge block – 100 mm දක්වා, මිනුම් කෝදු - 2000 mm දක්වා, Rule calibrator – 2000 mm දක්වා) ISO17025:2017 අංකශෝධන විද්‍යාගාර සඳහා වන ප්‍රතීතණය ලබා ගෙන ඇත. එම ප්‍රතීතනය ලබා ගැනීම මත කාර්මික අංශයේ පාරිභෝගික අංකශෝධන අතරින් gauge block හා මිනුම් කෝදු සඳහා ජාත්‍යන්තර පිළිගැනීම සහිත ISO 17025: 2017 ප්‍රතීතණය සහිත අංක ශෝධන සහතික නිකුත් කරනු ලැබේ.

0 සිට 25 mm දක්වා පරාසයේ බාහිර මයික්‍රොමීටර් (External micrometer) අංකශෝධනයට අදාල විශේෂඥ සමාලෝචන කටයුතු අවසන් කර ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් ලබා දෙන ISO 17025:2017 ප්‍රතීතනය අපේක්ෂාවෙන් සිටිති.

මෙයට අමතරව පීඩනය හා පරිමාව පිළිබඳ විද්‍යාගාර විසින් ලබා ඇති ප්‍රතීතන යාවත්කාලීන කර පවත්වාගෙන යාම.

මෙම දෙපාර්තමේන්තුවේ පරිමාමිතිය හා පීඩනය පිළිබඳ විද්‍යාගාර එක්ව Infusion Pump/Syringe Pump යන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භාවිතා කරන උපකරණ අංකශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සැකසීමට හා එම ක්ෂේත්‍ර වලට අංකශෝධන පහසුකම් ලබා දීමට අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කිරීම සැළසුම් කර ඇත. මෙම කටයුත්ත PTB (Physikalisch Technische Bundesanstalt) – MEDEA (Metrology – Enabling Developing Economies in Asia) ව්‍යාපෘතිය යටතේ සිදු වන්නකි. ඒ සඳහා සම්පත් දායකත්වය සපයනු ලබන්නේ තායිලන්තයේ ජාතික මිනුම් පරියේෂණාගාරය මඟිනි.

*වගු අංකය 3. 13 පීඩනය හා පරිමාව පිළිබඳ විද්‍යාගාර විසින් ලබා ඇති ප්‍රතීතන යාවත්කාලීන කර පවත්වාගෙන යාම.*

| විද්‍යාගාරය | මිනුම් | අන්තර් සංසන්දනය |
|---|---|---|
| මානමිතික මිනුම් විද්‍යා අංශය | දිග පිළිබඳ මිනුම් | වර්නියර් කැලිපර් සහ ඩයල් කැලිපර් අන්තර් සන්සන්දනය (දේශීය විද්‍යාගාර සමඟ) |
| පීඩනමිතික විද්‍යාගාරය | වායු පීඩනය (35 **bar)** | ජර්මනියේ ජාතික මිනුම් විද්‍යා ආයතනයේ (**PTB)** අනුග්‍රහය යටතේ මධ්‍යම අප්‍රිකානු කලාපයේ පිහිටි ජාතික මිනුම් විද්‍යා ආයතනය (**NMI)** සමඟ පවත්වනු ලබන අන්තර් සංසන්දනය සඳහා නියමු විද්‍යාගාරය හා නිර්දේශිත අගයන් (**reference value)** සැපයීම. එම අන්තර් සංසන්දන වැඩසටහනෙහි මිනුම් විද්‍යා උපදේශක ලෙස පීඩන විද්‍යාගාරයේ ප්‍රධානි **I.S.M.**සිල්වා , නියෝජ්‍ය අධ්‍යක්ෂ කටයුතු කරයි. මේ සඳහා උස්බෙකිස්ථානය, කිරිකිස්ථානය, මොන්ගෝලියාව හා ජෝර්ජියාව. යන රටවල් සහභාගි වේ. |
| පීඩනමිතික විද්‍යාගාරය | ද්‍රව පීඩනය (1000 **bar)** | දේශියව ඇති අංකශෝධන විද්‍යාගාර සඳහා ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යාගාරය (**NMI)** ලෙස ඔවුන්ගේ පීඩන මිනුම් සංසන්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මේ සඳහා දේශියව ඇති අංකශෝධන විද්‍යාගාර **11** ක් පමණ සහභාගි වේ. එමඟින් එම ආයතනවල පීඩන මිනුම් වල නිරවද්‍යතාව තහවුරු කිරීම අපේක්ෂා කරයි. |
| පරිමාමිතික විද්‍යාගාරය | පරිමාව (20 **l, 100 ml)** | **APMP.M.FF. K4** පරිමාව සම්බන්ධ අන්තර් සංසන්දනය චීනයේ ජාතික මිනුම් පර්යේෂණාගාරයේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර ඇත. මෙම අන්තර් සංසන්දනය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යාගාරය ඇතුළු රටවල් 14 ක් පමණ සහභාගි වේ. |

මූලාශ්‍රය : මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තු

### iii. ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්

2024 නොවැම්බර් දක්වා කාර්මික අංක ශෝධන ආදායම රු. මි. 6.94 ක්ද, උපකරණ මාදිලි අනුමැති ආදායම රු. මි. 1.4 ක් හා කිරුම් හා මිනුම් උපකරණ සත්‍යාපන පරීක්ෂණ ආදායම (රු.මිලි) 352.25 ක් වශයෙන් දැක්විය හැක.

## 3.7. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ වැඩසටහන 1998 දී ආරම්භ වී ඇති අතර එහි ප්‍රධාන පරමාර්ථය වී ඇත්තේ, ගම්බද ප්‍රදේශවල ගොවි නිෂ්පාදකයින්ගේ, නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධන උපාය මාර්ගයක් ලෙස ඔවුන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් තහවුරු කිරීම මෙන්ම දිවයිනේ පාරිභෝගික ජනතාවට පහසුවෙන් හා සාධාරණ මිලකට භාණ්ඩ හා ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට අවස්ථාව උදාකිරීමේ අරමුණින් දීප ව්‍යාප්ත පුළුල් බෙදාහැරීමේ ජාලයක් ඇති කිරීමය.මේ වන විට ආර්ථික මධ්‍යස්ථානවල නිසි ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික උපදෙස් ලබා දීම, පසුවිපරම් කිරීම හා ඇගයීම සිදු කරනු ලබයි.

ඒ අනුව, සිදුකරන ලද කාර්යයන් පහත පරිදි වේ.

i. කළමනාකරණ භාර සඳහා භාර සාමාජිකයින් පත් කිරීම සහ යාවත් කාලීන කිරීම.
ii. ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ අරමුදල් භාරය (භාර ඔප්පුව) ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.
iii. ව්‍යාපාර පරිශ්‍ර බදු දීම සම්බන්ධයෙන් ආර්ථික මධ්‍යස්ථාන සියල්ලටම පොදු බදු ගිවිසුමක් සකස් කිරීමට කටයුතු කිරීම.
iv. ආර්ථික මධ්‍යස්ථාන පිහිටි භූමියේ ඉඩමේ අයිතිය සම්බන්ධව ගැටළු නිරාකරණය කර ගැනීම සම්බන්ධ කටයුතු කිරීම.
v. ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරයේ සංයුතිය පුළුල් කිරීම සඳහා කටයුතු සිදු කිරීම.
vi. ආර්ථික මධ්‍යස්ථාන වල අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම.

### 3.7.1 ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානයන්හි මූල්‍ය ප්‍රගතිය ( 2024.01.01 - 2024.12.31 )

*වගු අංකය 3. 14 ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානයන්හි මූල්‍ය ප්‍රගතිය*

| අනු අංකය | ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානයේ නම | මුළු ආදායම (රු.) | මුළු වියදම (රු.) | අතිරික්තය/ ඌනතාවය (රු.) |
|---|---|---|---|---|
| 1 | දඹුල්ල | 101,924,209.67 | 42,434,786.88 | 59,489,422.79 |
| 2 | නුවරඑළිය | 22,347,993.00 | 1,738,372.00 | 20,609,621.00 |
| 3 | කැප්පෙටිපොල (2024.09.30) | 37,245,071.43 | 10,987,401.20 | 26,257,670.23 |
| 4 | තඹුත්තේගම | 36,287,967.00 | 21,139,706.00 | 15,148,261.00 |
| 5 | ඇඹිලිපිටිය | 38,630,577.63 | 37,981,338.83 | 649,238.80 |
| 6 | මීගොඩ | 21,536,605.40 | 20,380,617.18 | 1,155,988.22 |
| 7 | වැලිසර | 18,286,438.35 | 9,276,634.69 | 9,009,803.66 |
| 8 | වේයන්ගොඩ | 18,020,036.00 | 17,076,205.00 | 943,831.00 |
| 9 | නාරාහේන්පිට | 120,377,600.00 | 60,632,000.00 | 59,745,600.00 |
| 10 | රත්මලාන | 32,737,372.00 | 14,111,515.52 | 18,625,856.48 |
| 11 | පිළියන්දල | 19,736,799.41 | 15,962,621.96 | 3,774,177.45 |
| 12 | කන්දෙහන්දිය | 134,650.00 | 104,758.00 | 29,892.00 |
| 13 | කුරුදුවත්ත (2024.11.30) | 3,800,973.53 | 1,873,139.93 | 1,927,833.60 |
| 14 | අම්පාර | 943,056.00 | 769,436.00 | 173,620.00 |
| | **එකතුව** | **472,009,349.42** | **254,468,533.19** | **217,540,816.23** |

මූලාශ්‍රය : වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය, සංවර්ධන අංශය

### 3.7.2 ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානවල භාර අරමුදල් මගින් සිදුකළ කාර්යයන්හි ප්‍රගතිය

*වගු අංකය 3. 15 ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානවල භාර අරමුදල් මගින් සිදුකළ කාර්යයන්හි ප්‍රගතිය*

| අනු අංකය | ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථානයේ නම | සංවර්ධන කාර්යය | ඇස්තමේන්තුගත මුදල් (රු.) | භෞතික ප්‍රගතිය % | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 1 | නාරාහේන්පිට | එළවළු පරිශ්‍රයේ කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම. | 1,561,802.50 | 100 | 100 |
| | | මෝටර් බයිසිකල් නැවැත්වීමට රථගාලක් සැකසීම. | 1.125,350.20 | 100 | 95 |
| | | එළවළු පරිශ්‍රය සඳහා ඇතුළු වන දොරටු සඳහා ආවරණ වහල සැකසීම. | 573,429.72 | 100 | 100 |
| | | MD ආයතනය අසල නව ගේට්ටුවක් සැකසීම. | 594,400.80 | 100 | 100 |
| | | එළවළු පරිශ්‍රයේ විදුලි මනු සඳහා අරක්ෂිත ආවරණයක් සැකසීම. | 254,000.00 | 100 | 95 |
| | | රෙදිපිළි සංකීර්ණයේ ආවරණ වහල සකස් කිරීම. | 1,265,402.73 | 100 | 100 |
| | | STC ගබඩාව අසල නව ගේට්ටුව සකස් කිරීම. | 349,034.76 | 100 | 100 |
| | | මධ්‍යස්ථාන තාප්පය වටා තීන්ත ආලේප කිරීම. | 1,218,118.35 | 100 | 95 |
| | | දෛනික කසල රඳවනයේ දොර පියන් අලුත්වැඩියා කිරීම. | 304,367.00 | 100 | 95 |
| | | එළවළු පරිශ්‍රය වටා කොන්ක්‍රීට් කිරීම | 326,506.00 | 100 | 95 |
| 2 | තඹුත්තේගම | ආර්ථික මධ්‍යස්ථානයේ ජෙනරේටර් කාමරය හා ආරක්ෂිත මුරපොල ස්ථාපනය | 42,031,991.68 | 100 | 30 |
| 3 | ඇඹිලිපිටිය | ගොඩනැගිලි පිවිසුම් සඳහා යකඩ ගේට්ටුව සවි කිරීම | 2,464,841.30 | 100 | 100 |
| | | ආර්ථික මධ්‍යස්ථානයේ ආපනශාලාව අලුත්වැඩියා කිරීම | 2,942,670.78 | 100 | 100 |
| | | දෙමහල් ගොඩනැගිල්ලේ වැසිකිළි අලුත්වැඩියා කිරීම. | 746,127.93 | 100 | 100 |
| | | මධ්‍යස්ථානයේ ඉදිරිපස පඩිපෙළ කොටසට ටයිල් ඇතිරීම හා මධ්‍යස්ථාන කාර්යාලය තුළ ටයිල් ඇතිරීම. | 661,402.86 | 100 | 100 |
| 4 | මීගොඩ | ආර්ථික මධ්‍යස්ථානයේ ජල ටැංකිය අලුත්වැඩියා කිරීම | 1,362,130.75 | 100 | 90 |
| | | ආර්ථික මධ්‍යස්ථානයේ සෙලාන් බැංකු ගොඩනැගිල්ලේ දිරාපත් වී ඇති වැහිපීලි ප්‍රතිසංස්කරණය | 105,779.75 | 100 | 90 |
| 5 | පිළියන්දල | විදුලි රැහැන් පද්ධතිය අළුත්වැඩියා කිරීම නාම පුවරු දෙකක් අලුත්වැඩියා කිරීම | 312,258 | 100 | 100 |
| | | මහජනතාව ගමන් කරන වෙළෙඳ පරිශ්‍ර අතර මංතීරුව තීන්ත ආලේප කිරීම | 100,000 | 100 | 100 |
| | | කැඩී ඇති විදුලි මීටර පෙට්ටි අලුත්වැඩියා කිරීම. | මේ වන තුරු ගෙවා නැත. | 50 | |
| | | මාළු ලැලි ගොඩනැගිල්ල ඉදිරිපස ඇති අනවශ්‍ය කොන්ක්‍රීට් බැම්ම කඩා ඉවත් කිරීම | 314,840 | 100 | 100 |
| | | වැසිකිළි පද්ධතියේ දොරවල් අලුත්වැඩියා කිරීම | 172,536.10 | 100 | 100 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | වැලිසර | 2 වන හා 3 වන ගොඩනැගිලි වල පරිශ්‍රයන්හි බාහිර බිත්ති වල තීන්ත ආලේපය<br>E ව්‍යාපාර පරිශ්‍ර පිහිටා ඇති ගොඩනැගිලි බිම් කොටසහි පොළොව පුපුරා ගොස් තැනින් තැන කඩතොළු වී තිබීම නිසා යථා තත්වයට පත් කිරීම.<br>2, 3 ගොඩනැගිලි වල අභ්‍යන්තරයේ ගලි වලවල් වලින් ජලය උතුරා යාම හේතුවෙන් නැවත යථා තත්වයට පත් කිරීම<br>අබලන්ව පවතින නාම පුවරුව අලුත්වැඩියා කිරීම | 556,215.45<br>157,916.81<br>606,743.34<br>980,000 | 100<br>100<br>100<br>100 | 90<br>100 |
| 7 | රත්මලාන | වහලයේ පිල්ල අළුත්වැඩියා කිරීම<br>මාළු පරිශ්‍රය ගබඩා පරිශ්‍රයක් බවට පත්කිරීම.<br>ආර්ථික මධ්‍යස්ථානයේ ඇති දැල් ආවරණ ප්‍රතිසංස්කරණය කිරීම.<br>පොලිස් මුර පොළහි වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම<br>ආර්ථික මධ්‍යස්ථානයේ අබලන් වී ඇති මාර්ග පද්ධතිය කාපට් කිරීම | 26,200,586.12<br>2,458,536.68<br>2,251,750.24<br>96,264.30<br>9,000,000 | 95<br>100<br>100<br>100<br>100 | 92<br>90<br>90<br>90<br>90 |
| 8 | දඹුල්ල | බැංකු සංකීර්ණ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම | 26,714,124.48 | 0 | 0<br>මිල ගණන් කැඳවීම සිදු කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. |

මූලාශ්‍රය : වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය සංවර්ධන අංශය

## 3.8. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

### i. ආයතනයේ කාර්යභාරයන්ගේ භෞතික ප්‍රගතිය

### (අ) පේටන්ට් (2024.01.01 සිට 2024.11.30 දක්වා)

*වගු අංකය 3. 16 භෞතික ප්‍රගතිය*

| කාරණය | ජාතික | ජාත්‍යන්තර | PCT | එකතුව |
|---|---|---|---|---|
| ලද අයදුම්පත් සංඛ්‍යාව | 224 | 07 | 170 | **401** |
| ද්විතීයික පරීක්ෂාවෙන් පසු ලියාපදිංචිය සඳහා පිළිගත් සංඛ්‍යාව | 27 | 11 | 111 | **149** |
| ද්විතීයික පරීක්ෂාව සිදු කර දෝෂ දක්වා යැවීම් සහ ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව | 223 | 13 | 146 | **382** |
| ප්‍රසිද්ධියට පත් කරන ලද සංඛ්‍යාව | 28 | 07 | 96 | **131** |
| ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව | 35 | 06 | 102 | **143** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

### (ආ) කාර්මික සැලසුම් (2024.01.01 සිට 2024.11.30 දක්වා)

*වගු අංකය 3. 17 කාර්මික සැලසුම්*

| කාරණය | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|
| ලද අයදුම්පත් සංඛ්‍යාව | 159 | 36 | **195** |
| ද්විතීයික පරීක්ෂාවෙන් පසු ලියාපදිංචිය සඳහා පිළිගත් සංඛ්‍යාව | 42 | 23 | **65** |
| ද්විතීයික පරීක්ෂාව සිදුකර ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව | 61 | 03 | **64** |
| ප්‍රසිද්ධියට පත් කරන ලද සංඛ්‍යාව | 49 | 26 | **75** |
| ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව | 46 | 30 | **76** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

### (ඇ) වෙළඳ ලකුණු (2024.01.01 සිට 2024.11.30 දක්වා)

*වගු අංකය 3. 18 වෙළඳ ලකුණු*

| | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|
| ලද අයදුම්පත් සංඛ්‍යාව | 8,157 | 2,846 | **11,003** |
| ද්විතීයික පරීක්ෂා කරන ලද සංඛ්‍යාව | 9,485 | 3,937 | **134,22** |
| පිළිගන්නා ලද අයදුම්පත් සංඛ්‍යාව | 6,081 | 4,105 | **10,186** |
| ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව | 2,617 | 467 | **3,084** |
| ප්‍රසිද්ධියට පත් කරන ලද සංඛ්‍යාව | 3,579 | 3,395 | **6,974** |
| ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව | 3,499 | 3,139 | **6,638** |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

## ii. 2024 වසරේ සිදුකරනු ලැබූ ප්‍රධාන කාර්යයන්

### අ) බුද්ධිමය දේපළ ලිපි ගොනු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීම

මෙම ව්‍යාපෘතිය ලෝක බුද්ධිමය දේපළ සංවිධානය සහ ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය අතර බුද්ධිමය දේපල කාර්යාලයේ ව්‍යාපාරික සේවා සංවර්ධනය සඳහා යෝජිත ද්වී පාර්ශ්වික සහයෝගිතා ගිවිසුම යටතෙහි ශ්‍රී ලංකාව වෙත නොමිලේ ලැබෙන සේවා පහසුකමකි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ගිවිසුම්ගත වීමට අදාළ මූලික කටයුතු ආරම්භ කිරීමට 2024 වර්ෂයේ දී හැකිවීය.

### ආ) මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම සඳහා මූලික කාර්යයන් අවසන් කිරීම

වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ පහසුකම් සපයන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන සිදුකිරීමට ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ හා නීති කෙටුම්පත් සම්පාදකගේ එකගතාවය සහිතව නීතිපතිගේ අනුමැතිය ලබා ගැනීමට 2024 වර්ෂයේ දී හැකි විය. ඒ අනුව අමාත්‍යමණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට යොමු කර ඇත.

ඈ) **භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සැපයීම**

ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ විශේෂ ක්‍රමවේදයක් මෙතෙක් නොතිබුණු අතර, වෙළඳ ලකුණු යටතේ සහතික ලකුණක් ලෙස ලියාපදිංචි කිරීම පමණක් සිදු කර තිබේ. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට කෙටුම්පත් කර තිබූ රෙගුලාසි 2024.10.22 දින අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කිරීමට හැකි විය.

ඇ) **බුද්ධිමය දේපළ විෂය පිළිබඳව විදෙස් පුහුණු, වැඩසටහන් හා සමුළු සඳහා සහභාගීවීම**

බුද්ධිමය දේපළ විෂය පිළිබඳ විදෙස් පුහුණු, වැඩසටහන් හා සමුළු 12ක් සඳහා ආයතනික නිලධාරීන් 10දෙනෙකු යොමු කිරීමට 2024 වර්ෂය තුළ හැකි විය.

## 3.9. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

### i. 2024 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා ආයතනයේ ප්‍රගතිය

*වගු අංකය 3. 19 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය*

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| **පාරිභෝගික ආරක්ෂණය හා සහන සේවා** | |
| වෙළෙඳපොළ වැටලීම් | 22,543 |
| නඩු පැවරීම් | 22,344 |
| දඩ මුදල්(රුපියල්) | 192,010,999 |
| සාම්පල් පරීක්ෂාව | 73 |
| **පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්** | |
| මහජන දැනුවත් කිරීම් | 307 |
| වෙළෙඳ දැනුවත් කිරීම් | 102 |
| පාසල් දැනුවත් කිරීම් | 124 |
| ප්‍රදර්ශන | 07 |
| ජංගම දැනුවත් කිරීම් (වෙළෙඳ සහ මහජන) | 367 |
| විශේෂ දැනුවත් කිරීම් | 05 |
| මාධ්‍ය දැනුවත් කිරීම් - විද්‍යුත් මාධ්‍ය භාවිතය | 29 |
| මාධ්‍ය දැනුවත් කිරීම් - සමාජ මාධ්‍ය භාවිතය | 07 |
| **ලිඛිතව ලැබෙන පාරිභෝගික පැමිණිලි** | |
| නව පැමිණිලි ලැබීම් | 1,736 |
| ප්‍රතික්ෂේප කිරීම, වෙනත් ආයතන වෙත යොමු කිරීම සහ වැටලීම් | 595 |
| **විමර්ශන** | 756 |

| | |
|---|---|
| පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් පවත්වනු ලබන විමසීම් - 13 සහ 32 වගන්ති ප්‍රකාරව | 403 |
| විමසීම් අතරතුර පැමිණිලි විසඳීම | 88 |
| නියෝග නිකුත් කිරීම - 13 (4) වගන්තිය ප්‍රකාරව | 135 |
| අධිකරණ නඩු - නියෝග බලාත්මක කිරීම - (13(6) සහ 32 (7) | 34 |
| නීති හා බලාත්මක කිරීමේ අංශය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කරන ලද අධිකරණ නඩු (අධිකාරි පනතේ 11,30,31 සහ 57 වගන්තිය) | 37 |
| නඩු විභාග ඇතුළුව අධිකරණයේ පෙනී සිටීම<br>- මහේස්ත්‍රාත් අධිකරණ<br>- ශ්‍රේෂ්ඨාධිකරණ<br>- අභියාචනාධිකරණ<br>- දිසා අධිකරණය | <br>407<br>10<br>45<br>10 |
| සමථ කිරීමට මැදිහත් වූ පැමිණිලිවල වටිනාකම (රුපියල්) | 340,000 |
| **1977 පාරිභෝගික කෙටි පැමිණිලි සේවය (1977 Consumer Hotline)** | |
| මුළු පැමිණිලි ප්‍රමාණය | 2,757 |
| ක්‍රියාමාර්ග ගත් මුළු පැමිණිලි සංඛ්‍යාව | 1,348 |
| ක්‍රියාමාර්ග ගැනීමට නියමිත පැමිණිලි සංඛ්‍යාව | 1,409 |
| **තරඟකාරීත්ව ප්‍රවර්ධනය** | |
| ආර්ථික සංකේන්ද්‍රණය පාලනය කිරීම හෝ තුරන් කිරීම සෞඛ්‍ය සම්පන්න තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම - තරඟකාරී විරෝධී සහ අසාධාරණ වෙළඳ භාවිතයෙන් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සහ මැදිහත් වීම | |
| - විමර්ශනය සිදුකරමින් පවතින | 46 |
| - පසුගිය වර්ෂයේ ලද පැමිණිලි | 25 |
| - 2024 වර්ෂයේ ලද පැමිණිලි | 57 |
| - විසඳූ ආරවුල් | 36 |
| අධිකාරියේ ක්‍රියාකාරකම් සහ අනෙකුත් රෙගුලාසි පිළිබඳව වෙළඳුන් දැනුවත් කිරීම - තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම | 10 |
| හඳුනාගත් නිෂ්පාදන ආනයනය කිරීමෙන් වැළකී බදු/ බද්ද මගින් දේශීය කර්මාන්තය තරඟකාරී විරෝධී භාවිතයන්ගෙන් ආරක්ෂා කිරීම<br>- රෙගුලාසි අංක 87 ක්‍රියාත්මක කිරීම (HS කේත 5)<br>- වෙළඳපොලේ ආනයනික නිෂ්පාදන ආනයනයන්හි ප්‍රකාශිත/ සහතික කළ MRP නිරීක්ෂණය කිරීම | <br><br><br>198<br>85 |
| සෞඛ්‍ය සම්පන්න සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන පැවැත්වීම<br>- වෙළෙඳපල බුද්ධි සමීක්ෂණ පැවැත්වීම<br>- වාර්තා සැපයීම | <br><br>08<br>02 |
| වෙළෙඳපොළ සාම්පල පරීක්ෂා | 09 |
| තරඟකාරී විරෝධී චර්යා - වෙළඳපළ වැටලීම් | 23 |

මූලාශ්‍රය : පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## 3.10. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### i. සමිති විගණනයේ ප්‍රගතිය

සමිති 57 ක් විගණනය සඳහා බලය පවරා ඇති අතර එම 57 ම විගණනය අවසන් කර ඇත. භෞතික ප්‍රගතිය 100% කි.

### ii. සමිති අංශයේ ප්‍රගතිය

*වගු අංකය 3. 20 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමිති අංශයේ ප්‍රගතිය*

| | | |
|---|---|---|
| 1 | නව සමුපකාර සමිති ලියාපදිංචි කිරීම | 1 |
| 2 | කළමණාකාරීත්වය දුර්වල සමුපකාර සමිති සක්‍රීය කිරීම | 3 |
| 3 | අතුරු ව්‍යවස්ථා සංශෝධන සිදු කිරීම | 3 |
| 4 | සමුපකාර සමිති/සංගම්වල නිලවරණ පැවැත්වීම | 5 |
| 5 | නිලවරණ ක්‍රමවේද නොමැති සමුපකාර සමිති/සංගම් සඳහා නිලවරණ ක්‍රමවේදයක් සකස් කිරීමට මග පෙන්වීම් සිදු කිරීම | 1 |
| 6 | පිරිස්බල තක්සේරු සංශෝධනය කිරීම | 1 |
| 7 | සමුපකාර සමිති සංගම්වල ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 3 |
| 8 | සාමාජික තොරතුරු විමසීම සහ නිර්දේශ ලබාදීම සඳහා තීරණ ගැනීම | 163 |

මූලාශ්‍රය : සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### iii. නීති අංශයේ ප්‍රගතිය

*වගු අංකය 3. 21 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති අංශයේ ප්‍රගතිය*

| අනු අංකය | කාර්යය | ඉලක්කගත සංඛ්‍යාව | ක්‍රියාත්මක කිරීම | ප්‍රගතිය% |
|---|---|---|---|---|
| 01 | සමිති වල ඉල්ලීම මත බේරුම්කරුවන් පත් කිරීම | 37 | 21 | 56% |
| 02 | පාර්ශවකරුවන් විසින් යොමු කළ අභියාචනා සංඛ්‍යාව | 15 | 03 | 20% |
| 03 | උසාවි බල ගැන්වීම සඳහා ඉල්ලීම් | 60 | 55 | 91% |
| 04 | පරීක්ෂණ හා විමර්ශන නිලධාරීන් පත් කිරීම | 07 | 2 | 28.5% |
| 05 | ලියාපදිංචිය/ සංශෝධනය සඳහා ඉදිරිපත් කරන ලද අතුරු ව්‍යවස්ථා සංඛ්‍යාව | 04 | 04 | 100% |
| 06 | දෙපාර්තමේන්තුවට එරෙහිව පවරන ලද නඩු | 05 | 15 | 100% |

මූලාශ්‍රය : සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

අධිකරණයෙන් දෙපාර්තමේන්තුව වෙත අයවූ මුදල රු.මි. 9.18කි. එම මුදල් සමිති වෙත මුදාහැර ඇත.

iv. **පුහුණු අංශය**

පුහුණු වැඩසටහන් 10 ක් සැලසුම් කළ අතර එයින් වැඩසටහන් 09ක් සාර්ථකව අවසන් කර ඇත.

v. **බැංකු අංශය**

*වගු අංකය 3. 22 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු අංශයේ ප්‍රගතිය*

| | | |
|---|---|---|
| 01 | රේඛීය දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමිතිවලින් මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තා ගෙන්වා ගැනීම හා විශ්ලේෂණය, සමාලෝචනය හා උපදෙස් ලබා දීම. | 12 |
| | මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තා ගෙන්වා ගත් සහ විශ්ලේෂණය, සමාලෝචනය හා උපදෙස් ලබා දුන් සමිති ගණන | 03 |
| | භෞතික ප්‍රගතිය % | 25 % |
| 02 | බැංකු නියාමන පළාත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | 03 |
| | පැවැත්වූ බැංකු නියාමන පළාත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ගණන | 01 |
| | භෞතික ප්‍රගතිය % | 34 % |

මූලාශ්‍රය : සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

vi. **ගිණුම් අංශය**

ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය 100% වේ.

## 3.11. සමුපකාර සේවක කොමිෂන් සභාව

*වගු අංකය 3. 23 සමුපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යභාරය සම්බන්ධ ප්‍රගතිය*

| කාරණය | 2024 වර්ෂයේ දී ලැබී ඇති ප්‍රමාණය | විසඳුම් ලබා දී ඇති ප්‍රමාණය |
|---|---|---|
| අභියාචනා විසඳීම | 81 | 01 * |
| උපදේශන සේවා සැපයීම | 60 | 03 * |
| සේවකයින් බඳවා ගැනීම සහ උසස් කිරීම | 85 | 11 * |

මූලාශ්‍රය : **සමුපකාර සේවක කොමිෂන් සභාව**

* කොමිෂන් සභාවේ සභාපතිගේ හා සාමාජිකයින් දෙදෙනාගේ ධූර කාලය 2024.03.03 දිනෙන් අවසන් වූ පසු කොමිෂන් සභාව පත් කර නොමැති බැවින් තීරණ ලබා දීම සිදුවී නැත.

**සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා පැවැත්වූ සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළු**

සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළු 06 ක් පවත්වා ඇත.

*වගු අංකය 3. 24 දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම*

| අනු අංකය | වැඩමුළුව පැවැත්වූ සමිතිය / සංගමය | සහභාගීත්වය | වැඩමුළුවේ විෂය පථය | වියදම් වූ මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 33 | විනය කාර්ය පටිපාටිය | 26,230.00 |
| 02 | සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති මහා සංගමය | 27 | විනය කාර්ය පටිපාටිය | 20,980.00 |
| 03 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | 37 | වැටුප් හා දීමනා | 29,980.00 |
| 04 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය - දකුණු පළාත | 73 | විනය කාර්ය පටිපාටිය | 70,750.00 |
| 05 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය - වයඹ පළාත | 106 | විනය කාර්ය පටිපාටිය | 89,620.00 |
| 06 | සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | 34 | විනය කාර්ය පටිපාටිය | 28,360.00 |

මූලාශ්‍රය : සමුපකාර සේවක කොමිෂන් සභාව

## 3.12. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

### i. පාඨමාලා අංශය

ඩිප්ලෝමා පාඨමාලා 14ක්, සහතිකපත්‍ර පාඨමාලා 05ක් හා කෙටි කාලීන පාඨමාලා 46 ක් තුළින් රු. මි. 4.2 ක් උපයාගෙන ඇත.

### ii. අභ්‍යන්තර විගණන අංශය

අ) නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තා

විභාග අංශ වාර්තා- 4
අධ්‍යයන හා සංවර්ධන අංශ වාර්තා- 1
පාලන අංශ වාර්තා-03
නේවාසිකාගාර අංශ වාර්තා- 03
පුස්තකාල අංශ වාර්තා- 01
අධ්‍යයන හා සංවර්ධන අංශ වාර්තා- 01

ආ) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්ෂය තුළ 03ක් පවත්වා ඇත.

ඇ) අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තා 04ක් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

ඈ) NA 6537 අංක දරණ රථයේ ධාවන සටහනෙහි ඊට අදාළව නිකුත් කර ඇති ඉන්වොයිසිවල ඇති ධාවන දුර ප්‍රමාණයන් අසමාණතා පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.

ඉ) කළමනාකරණ මණ්ඩල තීරණයක් මත මෙම ආයතනයේ අභයන්තර කථිකාචාර්යවරුන්ගේ දේශන පැය හා එයට අදාළ දීමනා සම්බන්ධව පත් කළ කමිටුවේ කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කිරීම.

ඊ) කළමනාකරණ මණ්ඩල තීරණයක් මත ශ්‍රවනාගාරය ඉදිකිරීමට අදාළව ගෙවීම් සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා ඒ පිලිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලබා දීම සඳහා පත් කළ කමිටුවේ කමිටු සාමාජිකයකදු ලෙස කටයුතු කිරීම.

උ) කළමනාකරණ මණ්ඩල තීරණයක් මත කාර්ය මණ්ඩල මාසික වැටුප් අතිකාල දීමනා නිවාඩු දින වැටුප් SLIPS ක්‍රමය හරහා බැංකුගත කිරීම අධීක්ෂණය කිරීම.

### iii. ආයතනය විසින් සිදුකරන ලද කාර්යයන්

*වගු අංකය 3. 25 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් සිදුකරන ලද කාර්යයන්*

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| ජාත්‍යාන්තර සමුපකාර දින ආයතනික වැඩසටහන | ජාත්‍යන්තර සමුපකාර දිනය නිමිති කොටගෙන ආයතනයේ මහින්ද රාජපක්ෂ රඟහලේ දී ප්‍රථම වතාවට පර්යේෂණ සමුළුවක් 2024.07.26 දින පවත්වන ලදී. |
| ග්‍රන්ථ ප්‍රකාශන | සමුපකාර ග්‍රාමීය බැංකු ව්‍යාපාරය අභිමානවත් 60වන සංවත්සරය හා ශ්‍රීධර වින්සන්ට් සුබසිංහ 118 වන ජන්ම දින සැමරුම යන්න තේමා කර ගනිමින් 102 වන ජාත්‍යන්තර සමුපකාර දිනය සමගාමීව නව පිවිසුම සඟරාව එළි දැක්විණ. |
| කාර්යය මණ්ඩල පුහුණුව | මෙම ආයතනය අධ්‍යයන ආයතනයක් වන බැවින් විශේෂයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන වීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. එම නිසා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා ලබා දීමට අනුමැතිය ඉල්ලා අයවැය අධ්‍යක්ෂ වෙත හා අමාත්‍යංශ ලේකම් වෙත ද ලිපියොමු කර ඇත. එමඟින්, ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 උපදෙස් අභිබවා පුහුණු සඳහා ආයතනික ප්‍රතිපාදන යොමු කිරීම අනුමත කළ නොහැකි බව දන්වා ඇත. |
| කාර්යය මණ්ඩල ඇගයීම | මේ වන විට වාර මැද කටයුතු අවසන් කර ඇත. |
| කාර්යය මණ්ඩල සුභසාධනය හා සමාජ වගකීම් පිළිබඳ කාර්යයන් ඉටු කිරිම | වෙසක් පොහොය නිමිති කරගෙන මඤ්ඤොක්කා දන්සැලක් ආයතනයේ නිලධාරින්ගේ දායකත්වයෙන් පවත්වන ලදී.<br>ඩිප්ලෝමාධාරින් විසින් ආයතන පරිශ්‍රය තුළ ලේ දන්දීමේ කඳවුරක් පැවැත් වූ අතර ඒ සඳහා ආයතන නිලධාරින්ගේ දායකත්වය ද ලබා දෙන ලදී.<br>නිලධාරින් වෙනුවෙන් දන්ත වෛද්‍ය සායනයක් සුදන්ත ආයතනය මඟින් 2024.11.21 දින ආයතන පරිශ්‍රයේදී නොමිලයේ පවත්වන ලදී. |
| කළමනාකරණ මණ්ඩල කටයුතු | මේ වන විට කළමනාකරණ මණ්ඩල රැස්වීම් 08 ක් පවත්වා ඇත. |
| අධ්‍යයන මණ්ඩල කටයුතු | මේ වන විට අධ්‍යයන මණ්ඩල රැස්වීම් 01ක් පවත්වා ඇත. |

මූලාශ්‍රය : ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

## 3.13. සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

**i. ආදායම් සහ දළ ලාභය**

2024 දී රුපියල් බිලියන 8.18ක පිරිවැටුමක් වාර්තා කළ අතර එම වසරේදී ඉපයූ දළ ලාභය රුපියල් මිලියන 986 කි.

**ii. බදු ගෙවීමට පෙර ලාභය**

සංස්ථාව 2024 වසරේදී බදු පෙර ලාභය ලෙස රු. මිලියන 455 ක් උපයා ඇත.

**iii. 2024 වසරේ විශේෂ මෙහෙයුම්**

**අ) නිෂ්පාදන කළඹ පුළුල් කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව පරිභෝජ්‍ය වෙළඳපොලේ සැපයුම් හා මිලකරණය සුසංවිධිත කිරීමට රජයට අවශ්‍ය වූ සෑම අවස්ථාවකම, පාරිභෝගික භාණ්ඩ සහ ආහාර ද්‍රව්‍ය ආනයනකරුවකු හා බෙදා හරින්නකු ලෙස කටයුතු කරන ලදී. ඒ අනුව සහල් සහ බිත්තර හිඟයක් ඇති වූ අවස්ථාවේදී රේඛීය අමාත්‍යාංශය වූ වෙළඳ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මෙහෙයවීම හා මග පෙන්වීම යටතේ ලංකා සතොස අලෙවිසල් හරහා මහ ජනතාවට බෙදා හැරීම පිණිස අවශ්‍ය කරනු ලැබූ තොග ආනයනය මගින් එම තත්ත්වය මැනවින් කළමනාකරණය කරන ලදී. එසේම වෙළඳ පොළේ පැවැතිඋදු පරිප්පු හිඟය කළමනාකරණය පිණිස උදුපරිප්පු ආනයනය කොට බෙදා හරින ලදී.

රජයේ උපදෙස් යටතේ කහ තිරිඟු සත්ව ආහාර ලෙස ආනයනය කොට බෙදා හරින ලදී.

රජයේ සහාය ඇතිව, අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා පාසල් නිල ඇඳුම් රෙදි ආනයනය කරන ලද අතර ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි ආනයනය කරන ලදී.

2024 වසරේදී සුහුරු පුවරු (Smart Boards) ප්‍රවර්ධනය ආරම්භ කොට ව්‍යාප්ත කරන ලද අතර එය සංස්ථාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිෂ්පාදන කළඹට ඇතුළු වූ නව නිපැයුමක් විය.

**ආ) සේවක සංවර්ධනය**

මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස පිරිස් සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලද අතර 2024 මාර්තු වන විට සංස්ථාව සේවකයන් 300 ක ශ්‍රම බලකායක් පවත්වා ගෙන යන ලදී.

**ඇ) උපාය මාර්ගික මූලාරම්භ**

නව නිෂ්පාදන හඳුන්වා දීම මගින් නිෂ්පාදන කළඹ වැඩි දියුණු කිරීමට කටයුතු කළ අතර සහ පවතින නිෂ්පාදනවල ආදායම ඉහළ නංවා ගැනීම පිණිස අලෙවිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**ඇ) පරිපාලනය සහ අනුකූලතාව**

2023/2024 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දහතුනක් (13) සහ විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

## 3.14. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

**දඹුල්ල උෂ්ණත්ව පාලිත ගබඩා සංකීර්ණයේ ඉදිකිරීම් සිදු කිරිම**

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 98% ක් මේ වන විට අවසන්කර ඇත. ව්‍යාපෘතිය පිහිටා ඇති ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් පවරා ගැනීම සඳහා, එම අධිකාරිය විසින් ඉඩම සංවර්ධනය කිරීම සඳහා වූ වියදම් වශයෙන් වැය කරන ලද රු. මිලියන 21.4 මුදල සඳහා ගෙවීම් කටයුතු සිදු කර ඇති අතර ඉඩම පවරා ගැනීමේ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමින් පවතී. මෙම ව්‍යාපෘතියේ කළමනාකරණය සහ මෙහෙයුම් කටයුතු, කළමනාකරණ මණ්ඩලයක් මඟින් සිදු කිරීමට යෝජිත අතර එම කළමනාකරණ මණ්ඩලය මඟින් ගබඩා සංකීර්ණයේ මෙහෙයුම් කටයුතු, රාජ්‍ය පෞද්ගලික සහයෝගීත්වය යටතේ සිදු කිරීමට යෝජිතය. 2025 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිම කිරීම සහ කළමනාකරණ සහ මෙහෙයුම් කටයුතු සඳහා රු. මිලියන 382 ක් අවශ්‍ය වනු ඇත.

## 3.15. සමාගම් රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මෙම ආයතනයේ කාර්යයන් පෞද්ගලික සමාගම්, පොදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්, සීමා රහිත සමාගම් , සහ ලැයිස්තුගත සමාගම් සංස්ථාපනය කිරීම, විදේශීය සමාගම් සහ අක්වෙරළ සමාගම්, සමිති, පොදු කොන්ත්‍රාත්, උකස්බැඳුම්කර, සෘණපත්‍ර, ගණන් පරීක්ෂකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම, සමාගම් පනත සහ සමිති ආඥා පනත අනුව සමාගම් සහ සමිති වල තොරතුරු යාවත්කාලීන කිරීමට අදාළ ලේඛන ලියාපදිංචි කිරීම, සමාගම් ඈවර කිරීම හා විසුරුවා හැරීම, සමාගම්/සමිති වලට අදාළ සියළුම තොරතුරු යාවත්කාලීන කිරීම


සහතික පිටපත් නිකුත් කිරීම, මහජනතාව වෙත තොරතුරු ලබා දීම, ලේඛන තහවුරු කිරීම,ගාස්තු එකතු කිරීම හා සැසඳීම,රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත අවශ්‍ය තොරතුරු, සහතික පිටපත් ලබා දීම හා අවශ්‍ය සහාය ලබා දීම යන ඒවා වේ.

### සමාගම් වල නාමය අනුමත කිරීම

*වගු අංකය 3. 26 සමාගම් වල නාමය අනුමත කිරීම*

| | |
|---|---|
| නාම අනුමත කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 38,909 |
| අනුමත කළ සංඛ්‍යාව | 36,137 |
| ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව | 1,948 |

මූලාශ්‍රය : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව





**සංස්ථාපනය කරන ලද නව සමාගම් සංඛ්‍යාව 25,076**

**විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව**

*වගු අංකය 3. 27 විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව*

| විස්තරය | 2024.01.01 සිට 2024.11.30 දක්වා |
|---|---|
| සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම | 48 |
| ණයහිමියන් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම | 08 |
| අධිකරණයෙන් ඈවර කිරීම | 07 |
| පනතේ 394 යටතේ නම කපා හැරීම | 326 |
| ඒකාබද්ධ කිරීම හේතුවෙන් නම කපා හැරීම | 58 |
| විදේශ සමාගම්වල නාමය කපා හැරීම | 14 |
| එකතුව | 461 |

මූලාශ්‍රය : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව




මූලාශ්‍රය : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## 2024.01.01 දින සිට 2024.11.30 දක්වා ලියාපදිංචි කර ඇති සමිති සංඛ්‍යාව - 38

*වගු අංකය 3. 28 ලියාපදිංචි කර ඇති සමිති*

| සමිති වර්ගය | 2024.01.01 සිට 2024.11.30 දක්වා |
|---|---|
| විහාරස්ථාන | 1 |
| සුභසාධක සමිති | 37 |
| එකතුව | **38** |

මූලාශ්‍රය : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

# සිව්වන පරිච්ඡේදය

# 2025 - ඉදිරි සැලසුම්

## 04. 2025 - ඉදිරි සැලැසුම්

### 4.1. වෙළෙඳ, වාණිජ,ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය

i. වසර 02ක් තුළ නවීනතම අංගෝපාංග සහිත මහා පරිමාණ සහල් මෝලක් රු.බිලියන 10ක ආයෝජනයකින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

ii. ආහාර සුරක්ෂිතතාවය හා කාන්තා ව්‍යවසායකයන් බලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි. 200ක වියදමින් කුඩා හා මධ්‍ය පරිමාණ සහල් නිෂ්පාදන ව්‍යාපෘතිය අස්වැසුම ප්‍රතිලාභී කාන්තාවන් හා තෝරාගත් ලියාපදිංචි ගොවි සංවිධාන මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

iii. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සතු ගබඩා සංකීර්ණවල වහල මත සූර්යය පැනල ව්‍යාපෘති සඳහා යෙදවීමට කටයුතු කිරීම.

iv. 2018 අංක 02 දරණ ඩම්පිං සහ ප්‍රති විරෝධතා පනත සහ 2018 අංක 03 දරණ ආරක්ෂණ පියවර ක්‍රියාත්මක කර ඇතත් නිෂ්පාදන ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම ලෝක වෙළෙඳ සංවිධානයට දැනුම් දීම සහ වාණිජ දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

v. ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු පාලනය සඳහා පුළුල් නීතිමය පනතක් නොමැති බැවින් අපනයන නිෂ්පාදන කර්මාන්ත, භාණ්ඩ හා සේවා අපනයන සහ අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා නීතිමය ප්‍රතිපත්ති රාමුවක් සහිත ජාත්‍යන්තර වෙළෙඳ නීතියක් සකස් කිරීමට යෝජිතය.

vi. ව්‍යාපාර කොටස් අර්ථලාභීන් ලියාපදිංචි කිරිම පහසු කිරීම සඳහා 2007 අංක 07 දරණ සමාගම් පනත සංශෝධනය කිරීම.

vii. ශ්‍රී ලංකාවේ පවතින වත්මන් ආර්ථික හා සමාජීය තත්ත්වයට අනුරූපීව පාරිභෝගිකයාගේ අයිතීන් සුරැකීම හා අභ්‍යන්තර වෙළෙඳ කටයුතු විධිමත් කිරීම සඳහා 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත සංශෝධනය කිරීම.

### 4.2. වාණිජ දෙපාර්තමේන්තුව

i. වසරේ දී, කලාපීය වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්වලට යොමු වීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත.

ii. වෙළඳ සංවර්ධනය සඳහා, ITC 'USA/CLDP' යටතේ වැඩි සහායක් ලබා ගැනීම අපේක්ෂිතය.

iii. තෝරාගත් අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ B2B ප්‍රවර්ධන වැඩසටහන් තුනක් විදේශීය ගැනුම්කරුවන්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කිරීමට වාණිජ දෙපාර්තමේන්තුව සැලසුම් කරයි. මෙම ව්‍යාපෘතිය කර්මාන්ත අමාත්‍යාංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික වාණිජ මණ්ඩලය සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් පැවැත්වීමට අපේක්ෂිතය

iv. රජය විසින් ලබා දෙන විධාන / නියෝග අනුව, වාණිජ දෙපාර්තමේන්තුව බහුපාර්ශ්වික, කලාපීය සහ ද්විපාර්ශ්වික මට්ටමේ වෙළඳ සාකච්ඡා සඳහා සහභාගී වීම.

### 4.3. සීමාසහිත ලංකා සතොස සමාගම

i. නව ලංකා සතොස අලෙවිසැල් 150 ක් විවෘත කිරීම.
අලෙවිසැල් ජාලය ව්‍යාප්ත කිරීම තුළින් ආයතනයේ ආදායම වර්ධනය කිරීම මෙන්ම පරිමාණ ආර්ථික න්‍යාය අනුව, මිලදී ගැනීමේ කේවල් කිරීම සහ බෙදාහැරීමේ පිරිවැය කළමනාකරණය තුළින්, ඉතා අවම මිලට අත්‍යවශ්‍ය භාණ්ඩ පාරිභෝගිකයා වෙත ලබා දීම සහ පාරිභෝගිකයාට සමීප වීම මෙහි අරමුණයි.

ii. නව ඒකාබද්ධ ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතියක් ස්ථාපිත කිරීම.
තරගකාරී නවීන වෙළඳාම් ක්ෂේත්‍රයේ ප්‍රධාන තරගකරුවකු වන ලංකා සතොස ආයතනට ඉතා විශ්වාසනීය සහ කාර්යක්ෂම ඒකාබද්ධ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් අත්‍යවශ්‍ය වේ.

කාලීන කළමනාකරණ තීරණ ගැනීම උදෙසා සියළු අලෙවිසැල්, ගබඩා සහ ප්‍රධාන කාර්යාලය සම්බන්ධ කෙරෙන කාලීන නව සම්පත් සැලසුම් පද්ධතියක් ස්ථාපිත කිරිමට අපේක්ෂා කෙරේ. මෙමගින් ප්‍රසම්පාදන කාර්යය විධිමත් කිරිම තුළින් , තොග අධි සහ අඩු තත්වයන් මගහරවා ගැනීම, තොග ආපසු හැරවුම් ශුන්‍ය හෝ අවම තත්වයකට ගෙන ඒමට අපේක්ෂා කෙරේ.

iii. හැකියාවන්ගෙන් හෙබි සුදුසුකම් සහිත සේවකයින් බඳවා ගැනීම.
හැකියාවෙන් පිරිපුන්, අනියම් පදනම මත බඳවාගෙන තිබූ සේවකයන් 2024 වසර තුළදී ස්ථිර සේවකයන් ලෙස බඳවා ගැනීම තුළින් එම සේවකයන් අභිප්‍රේරණය තුළින් ආයතනයට වන ධනාත්මක බලපෑම සැලකිය යුතුවේ.

iv. ගොවීන්ගෙන් සෘජු මිළදී ගැණුම්
ගොවියාට නිසි වෙළඳපොලක් තනා දෙන අතර, අතරමැදියන් නොමැති වීම නිසා ඉතා අඩු මිලට අත්‍යවශ්‍ය භාණ්ඩ පාරිභෝගිකයාට ලබා දිමට අපේක්ෂා කෙරේ.

v. අමතර ආදායම් වර්ධනය
තරගකාරී වෙළඳපොලක ක්‍රියාත්මක වන අප ආයතනය, ලාභදායිත්වයක් කරා යාම සඳහා ඇති එකම මග අමතර ආදායමේ වර්ධනයයි.

vi. සියලු අලෙවිසැල්වල විශේෂ විගණනයක් සිදු කිරිම, නව අවස්ථා හඳුනා ගැනීම සහ මිල ගණන් නැවත තක්සේරු කිරිම හා වැඩිකිරීම තුළින් එය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.
තවද ප්‍රධාන සැපයුම්කරුවන් සමග ඒකාබද්ධ ව්‍යාපාර සැලසුම් ( Joint Business Plan ) නැවත පණගැන්වීම තුළින් අමතර ආදායම් වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

vii. දළ ලාභ ආන්තිකය වර්ධනය කිරීම.
සැපයුම්කරුවන් සමග කේවල් කිරීම තුළින් දළ ලාභ ආන්තික ප්‍රතිශතය වර්ධනය කිරීම තුළින් සමස්ථ ලාභයක් කරා යොමුවීමට අපේක්ෂා කෙරේ.

### 4.4. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව

i. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ප්‍රතිසංවිධානය කර නව මුහුණුවරකින් නැවත තොග වෙළෙඳ කටයුතු ආරම්භ කිරීම හා සතොස සතු ගබඩා 10ක් ප්‍රතිසංස්කරණය කිරීම.

ii. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව සතු හිඟුරක්ගොඩ හා පන්නෙගමුව සහල් මෝල් අළුත්වැඩියා කර නැවත නිසි පරිදි ක්‍රියාත්මත කිරීම.

iii. අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය තොග අලෙවිය සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ, තොග අලෙවිසැල් 03ක් කොළඹ, මාතර හා කුරුණෑගල ආරම්භ කිරීම.

iv. වී අලෙවි මණ්ඩලය, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හා සමුපකාර ව්‍යාපාරය ඒකාබද්ධව දිවයින පුරා වී මිලදී ගෙන වී මෙට්‍රික් ටොන් 300 000ක උපරිමයකට යටත්ව ගබඩා කිරීම. මේ සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් ලබා ගැනීමට පවතින ගබඩා අළුත්වැඩියා කිරීම සඳහා රු.මි. 50ක් වෙන් කිරීම.

v. සතොස ප්‍රවාහන සේවය, ආරක්ෂක සේවය හා ඉංජිනේරු ආදී උප ආයතන නව මුහුණුවරකින් ඒවායේ ව්‍යාපාර කටයුතු විධිමත් කර පවත්වාගෙන යාම සහ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ ඉන්ධන පිරවුම්හල නැවත විවෘත කිරීම.

vi. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සෘජු ආනයනය සඳහා කටයුතු ආරම්භ කිරීම.

vii. 2025 වසරේදී ලංකා සතොස නව අලෙවිසැල් 150ක් වෙළෙඳ ජාලයට එක්කිරීම හා පවතින වෙළෙඳසැල් 448 වසර 03ක් තුළ 1000ක් දක්වා වර්ධනය කිරීම හේතුවෙන් තොග වශයෙන් භාණ්ඩ ආනයනය කොට ඒවාට ලබා දීමට හැකියාව ලැබීම.

viii. සමූපකාර ජාලයට අවශ්‍ය අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කොට සාධාරණ මිලකට ලබා දීම තුළ වෙළෙඳපොළ මිල කළමණාකරණය කිරීමට හැකිවීම.

**4.5. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**

i. වර්ෂය තුළ දී 2022/2023 අධ්‍යයන වර්ෂ සිසුන් 17,000 සඳහා මහපොළ ශිෂ්‍යත්ව වාරික මුදල් ගෙවීමට අපේක්ෂිතය.

ii. මාර්ගගත මහපොළ ශිෂ්‍යත්ව පුස්තකාලය ආරම්භ කිරීම

iii. මාසික මහපොළ ශිෂ්‍යත්වය රු. 5,000 සිට රු. 7,500 දක්වා වැඩි කිරීමට රජය තීරණය කර ඇති බැවින්, අරමුදලේ සහ යෝජනා ක්‍රමයේ මූල්‍යමය තිරසාරභාවය සහතික කිරීම සඳහා මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට සම්පත් රැස් කිරීමට යෝජිතය. ඒ' සඳහා මාර්ගගත මහපොළ ලොතරැයි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ මහපොළ ශිෂ්‍යත්වයේ අතීත ප්‍රතිලාභීන්ට මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට දායක වීමට හැකි වන පරිදි මහපොළ ආදි ශිෂ්‍ය සංගමය පිහිටුවීම.

**4.6. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)**

**i. ප්‍රතීතන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන**

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය දැනටමත් පරීක්ෂණාගාර රසායනාගාර ප්‍රතීතන යෝජනා ක්‍රමයේ කාර්ය ප්‍රවාහය ඩිජිටල්කරණය සම්පූර්ණ කර ක්‍රියාත්මක කර ඇත. 2025 දී අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් සියලුම ප්‍රතීතන යෝජනා ක්‍රම සඳහා ඩිජිටල්කරණ කාර්ය ප්‍රවාහය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමත් සමඟ අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සිය සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට සැලසුම් කර ඇත.

**ii. ප්‍රතීතනය සඳහා ප්‍රවර්ධන හා සන්නාමකරණය හඳුන්වා දීම.**

20 වැනි සංවත්සරයට අදාළව, අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ප්‍රතීතනය පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සැලසුම් කරයි. සාමාන්‍ය ජනතාව, නියාමකයින්, අනුකූලතා තක්සේරු ආයතන, අදාළ රාජ්‍ය ආයතන ආදිය අවධානය යොමු කරමින් වසර පුරා වැඩසටහන් මාලාවක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

**iii. නව ප්‍රතීතන වැඩසටහන් හඳුන්වාදීම මගින් ආයතනය මගින් ලබාදෙන ප්‍රතීතන සේවාවන් තව දුරටත් පුළුල් කිරීමට කටයුතු කිරීම.**

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ISO/IEC 17034 (යොමු ද්‍රව්‍ය නිෂ්පාදකයින්) සහ Biobanking (ISO 20387) සඳහා නව ප්‍රතීතන යෝජනා ක්‍රම 2025 දී දියත් කිරීමට සැලසුම් කර ඇත. අලුතින් හඳුන්වා දී ඇති ප්‍රතීතන යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට යෝජිතය.

**iv. ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් පුළුල් කිරීමට කටයුතු කිරීම**

වසරේ සැලසුම් කර ඇති පුහුණු දින දර්ශනයට අමතරව, ඉලක්කගත විදේශීය සහ දේශීය සහභාගිවන්නන් සඳහා විවිධ ප්‍රතීතන යෝජනා ක්‍රම පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා විශේෂිත ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් පැවැත්වීමට අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සැලසුම් කර ඇත. මෙම වැඩසටහන් අදාළ යෝජනා ක්‍රම සඳහා සේවාදායක පදනම පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

**v. ජාතික තත්ත්ව කවුන්සිලය පිහිටුවීම**

ජාතික තත්ත්ව ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය අංශයේ සංවිධාන තුළ ගුණාත්මක සංකල්ප හා භාවිතයන් හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික තත්ත්ව කවුන්සිලය පිහිටුවීම මේ සඳහා අමප/24/1148/627/021 2024.07.10 දින අනුමැතිය ලැබී ඇත.

### 4.7. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

i. ජාතික මිනුම් පර්යේෂණාගාරයේ මධ්‍යගත වායුසමීකරණ පද්ධති ස්ථාපනය කිරීම. -1 වන අදියර සඳහා මිනුම් ඒකක,ප්‍රමිති හා සේවා අරමුදලින් රුපියල් මිලියන 555 ක් වෙන් කර ඇත.

ii. බලය, ධ්වනිය හා පරිමා ප්‍රවාහ යන නව මිනුම් ප්‍රමිති ස්ථාපනය කරමින් ජාතික මිනුම් පර්යේෂණාගාරයේ කාර්යභාරය පුළුල් කිරීම.

iii. දෙපාර්තමේන්තුවේ පුහුණු අංශයේ මිනුම් විද්‍යාව පිළිබඳ පාඨමාලාව සඳහා NVQ vi මට්ටම පිළිගත් වෘත්තීය පුහුණුවක් ලබා දීම දක්වා වැඩි දියුණු කිරීම. - ඇස්තමේන්තු මුදල රුපියල් 490,800 කි.

iv. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා මිනුම් විද්‍යාව විෂයක් ලෙස ඇතුළත් කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

කොළඹ විශ්වවිද්‍යාලය - පාඨමාලාව - IA – 4301 – Precision Measurement techniques and calibration of instruments

වව්නියා විශ්වවිද්‍යාලය - පාඨමාලාව - EN 541 (II)3 Metrology course

v. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත සහ රෙගුලාසි යාවත්කාලීන කිරීම. ඒ අනුව දෙපාර්තමේන්තු ෙ

vi. මිනුම් ප්‍රමිති කළමණාකරන තොරතුරු පද්ධතියක් සකස් කිරීම. - ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 70 කි. මෙහි දී දිස්ත්‍රික් කාර්යාල 25 ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ කිරීමත් වෙළෙඳ දත්ත පද්ධතිය සකස් කිරීම තුළින් පාරිභෝගික ජනතාවට නිවැරැදි හා විශ්වාසනීය කිරුම් මිනුම් සේවාවක් තහවුරු කිරීමත් අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘති ආයතනික අරමුදලින් ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතය

### 4.8. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන

ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන වඩාත් ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා කොරියන් ආධාර යටතේ කටයුතු කිරීම හා තෝරාගත් ආර්ථික මධ්‍යස්ථාන ආශ්‍රිතව අල, ළූණු හා පළතුරු ගබඩා කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ උෂ්ණත්ව පාලිත ගබඩා 05ක් ඉදිකිරීම.

### 4.9. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

i. මාර්ගගත ගෙවීමේ ක්‍රමයක් සහ මාර්ගගතව අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පහසුකම් සැලසීම.

ii. භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පහසුකම් සැලසීම.

iii. මැඩ්රිඩ් සන්ධානපත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා බුද්ධිමය දේපළ පනත සංශෝධන කිරීම.

iv. සුහුරු ක්‍රමවේදයන් අනුව බුද්ධිමය දේපළ කාර්යාලයේ කටයුතු ඉටුකිරීම.

v. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වන කාර්මික දේපළ පරිපාලන පද්ධතිය (IPAS) එහි හතරවන මට්ටමට වැඩිදියුණු කිරීම.

vi. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයේ (WIPO) අරමුදල් යොදවා ක්‍රියාත්මක කිරීම හා බුද්ධිමය දේපළ ප්‍රතිපත්තියක් සකස් කිරීම.

### 4.10. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

i. පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් සඳහා වන ආරක්ෂණ පියවර

පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සඳහා පහත සඳහන් නියාමන පියවර හඳුන්වා දීමට තීරණය කර ඇත.

මිලදී ගත් භාණ්ඩවල පිරිවැය සහ බදු සංරචකය වෙන වෙනම හඳුනා ගැනීම සඳහා බිඳවැටීමක් සහිතව පාරිභෝගිකයින්ට සහ නිෂ්පාදකයින්ට යන්ත්‍ර මුද්‍රිත ඉන්වොයිසි අනිවාර්යයෙන් නිකුත් කිරීම නියාමනය කිරීම.

මේ සඳහා, සියලුම අගය එකතු කළ බදු ලියාපදිංචි ව්‍යාපාර හෝ වෙළඳ ආයතනවලට විකුණුම් ලක්ෂ්‍ය (PoS) යන්ත්‍රයක් ස්ථාපනය කර මිලදී ගත් භාණ්ඩවල පිරිවැය, බදු සහ අනෙකුත් ගාස්තු සමඟ යන්ත්‍ර ජනනය කරන ලද ඉන්වොයිසියක් පාරිභෝගිකයින්ට වෙන වෙනම නිකුත් කිරීමට නියෝග කිරීමට නියාමනය ප්‍රකාශයට පත් කර ඇත.

ගනුදෙනුකරුවෙකු තම විද්‍යුත් ගෙවීම් කාඩ්පත් භාවිතයෙන් ගෙවීම් කරන විට, ඉන්වොයිස් මුදලට අමතරව, වෙළඳ ආයතන, අවන්හල් සහ ආපනශාලා ගණනාවක් ඉන්වොයිස් වටිනාකමෙන් 1.5% සිට 3% දක්වා ගාස්තුවක් අය කරන බැවින්. මෙම ආකාරයේ භාවිතය ඩිජිටල් ගෙවීම් පද්ධතියට බාධා කරයි. එබැවින්, මෙවැනි අනවසර ගාස්තුවක් හෝ පාරිභෝගිකයින්ගෙන් අය කිරීම නියාමනය කිරීමට යෝජනා කෙරේ.

ඉහත ගැටළු වලින් පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු අධිකාරිය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සුදුසු නියාමන පියවර ගනු ඇත.

iii. පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්යයන් වඩාත් පහසු කරමින් පාර්භෝගික ජනතාවට හිතැති සේවාවක් සැපයීම අරමුණු කර ගනිමින් අධිකාරියේ කටයුතු ඩිජිටල්කරණය සඳහා ආයතනික අරමුදලින් රු.මි. 140ක වියදමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

## 4.11. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

i. නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කරමින් නිෂ්පාදන සමුපකාර 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් ආරම්භ කිරීම.
ii. රු.මි. 25ක ආයෝජනයෙන් අත් යන්ත්‍ර හා බලවේග පේෂකර්ම, උම්බලකඩ හා කරවල නිෂ්පාදන, බිම්මල් නිෂ්පාදන සහ වී බැංකු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
iii. වී මිලදී ගැනීමේ ඒකාබද්ධ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
iv. සමුපකාර පනත (1972 අංක 05) සංශෝධනය කිරීම.

## 4.12. සමුපකාර සේවක කොමිෂන් සභාව

i. සමුපකාර සේවකයින් සඳහා වැටුප් සංශෝධනයක් ක්‍රියාත්මක කිරීම.
ii. සමුපකාර සේවා නියුක්තිකයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
iii. සමුපකාර සේවක බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය යාවත්කාලීන කොට ක්‍රියාත්මක කිරීම.
iv. විනය කාර්ය පටිපාටිය යාවත්කාලීන කොට වර්තමානයට ගැලපෙන අන්දමට සකස් කිරීම.

## 4.13. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

i. උපදේශන වැඩසටහන් 04ක්, නිත්‍ය පුහුණු පාඨමාලා 01ක්, ඩිප්ලෝමා පාඨමාලා 08ක්, සහතිකපත්‍ර පාඨමාලා 04 ක් හා කෙටිකාලීන පාඨමාලා 45ක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර ආපේක්ෂිත මුළු සහභාගීත්වය 1825කි.
ii. ආයතනය මඟින් පවත්වන සියලුම ඩිප්ලෝමා පාඨමාලාවන්හි විෂය අන්තර්ගතය සමුපකාර ව්‍යාපාරයේ අවශ්‍යතාව පරිදි සමාලෝචනය කර ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) තත්ත්වය ලබා ගැනීම හා SLQF-4 මට්ටමේ උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම.
iii. සමුපකාර විෂයය ක්ෂේත්‍රයේ දැනුම කේන්ද්‍රස්ථානය වන ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ පුස්තකාලය, ස්වයංක්‍රීයකරණය හා “Digitalization” කිරීම.
iv. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සියළුම සමුපකාර සමිති ආවරණය කරමින් එම සමිතිවල දත්ත ඇතුළත් ඩිජිටල් සමුපකාර සමිති දත්ත පද්ධතියක් ස්ථාපිත කර පවත්වා ගෙන යාම.
v. ශ්‍රී ලංකාව තුළ පවතින නිෂ්පාදන විවිධ සේවා සමුපකාර සමිති බලගන්වමින් අපනයන තත්වයට වර්ධනය කර ගැනීම සඳහා පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම.
vi. සමුපකාර සමිති ඇතුළු සමුපකාර ආයතන ආශ්‍රිතව නීතිමය, මූල්‍යමය, ගිණුම් හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි නව මුහුණුවරකින් යුත් කෙටි, මධ්‍ය හා දිගුකාලීන පාඨමාලා ආරම්භ කර සමුපකාර ව්‍යාපාරයත් එහි සේවය ලබන ගනුදෙනුකරුවන් ඇතුළු සියළුම සමුපකාර සේවාලාභීන් සුරක්ෂිත කර නව මුහුණුවරකින් සමුපකාර ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අදාළ කටයුතු සිදු කරමින් ආර්ථික සුරක්ෂිතතාවය සහිත ආයතනයක් ලෙස ජාතික සමුපකාර සංවර්ධන ආයතනය 2025 වර්ෂයේ සිට කටයුතු කිරීමට අපේක්ෂිතය.

vii. සමුපකාර පිළිබඳ දැනුම පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම සහ ගුරුවරුන් දැනුම්වත් කිරීමට කටයුතු කිරීම.

viii. සමුපකාර සංවර්ධන ආයතනය විශ්ව විද්‍යාල මට්ටමට උසස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය.

## 4.14. සීමාසහිත රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

i. වෙළඳපොළ මිල සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයුම ස්ථාවර කිරීමට රජයට අවශ්‍ය වූ කවර හෝ විටකදී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම සහ බෙදා හැරීම. ඒ අනුව 2025 වසරේ වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීම පිණිස සහල් සහ ලුණු ආනයනය කිරීම.

ii. රජයේ ඩිජිටල් ප්‍රතිපත්තියට අනුගත වෙමින් සුහුරු පුවරු සහ අනෙකුත් තොරතුරු තාක්ෂණික නිෂ්පාදන ප්‍රවර්ධනය ව්‍යාප්ත කිරීම.

iii. ප්‍රාග්ධනය සඳහා රජයේ අරමුදල් ලබා ගනිමින් ඉඩමක් මිලදී ගෙන පුපුරණ ද්‍රව්‍ය ගබඩාවක් ඉදි කිරීම.

iv. නව ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධතියක් ක්‍රියාවට නැංවීම

v. අවට ප්‍රදේශයේ පවතින අනෙකුත් පරිශ්‍රයන් මෙන් නවම් මාවත ප්‍රදර්ශනාගාරය ප්‍රතිසංස්කරණය කොට නවීකරණය කිරීම සහ එය පාරිභෝගිකයන් සඳහා ආකර්ෂණීය ස්ථානයක් බවට පත් කිරීම.

vi. සංස්ථාවේ ප්‍රදර්ශනාගාර ජාලය පුළුල් කරමින් නව ප්‍රදර්ශනාගාර දෙකක් විවෘත කිරීම.

vii. පවතින නිෂ්පාදන කළඹට නව නිපැයුම් හඳුන්වාදීම මගින් අලෙවියේ අතිරේක වර්ධනයක් අත් කර ගැනීම.

viii. පාරිභෝගික පදනම තව දුරටත් රාජ්‍ය අංශයේ ආයතන සහපුද්ගලික අංශයේ ආයතන වෙත ව්‍යාප්ත කිරීම මගින් පිරිවැටුම ඉහළ නංවා ගැනීම.

ix. ආයතනයේ අනාගත බිහිදසුන

ජාතික ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම සහ "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය සාක්ෂාත් කර ගැනීමට සහාය වීම පිණිස සිය ශක්තීන් උපරිමව යොදා ගනිමින් නව නිෂ්පාදන කාණ්ඩ සහ වෙළඳපොළ වෙත සිය ව්‍යාප්තිය අඛණ්ඩව පවත්වා ගෙන යාමට අපේක්ෂිතය.

## 4.15. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

i. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඉදිකර ඇති දඹුල්ල උෂ්ණත්ව පාලිත ගබඩාව ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීම.

ii. ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා නවීකරණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

iii. ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා වහලය මත සූර්ය තාපය මඟින් විදුලිය නිපදවා අමතර ආදායමක් ලබා ගැනීමට සැලසුම් කිරීම.

## 4.16. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

i. "සමාගම් මැදුර" ගොඩනැගිල්ලේ මහල් 4ක් නවීකරණය හා අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රු.මි.150ක් යෙදවීමට අපේක්ෂිතය.

ii. වාහන අළුත්වැඩියා, කාර්යාල උපකරණ හා ආයතනික කටයුතු සංවර්ධනය සඳහා රු.මි. 32ක් ආයතනික අරමුදල් වලින් ආයෝජනය කිරීමට සැලසුම් කර ඇත.





ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස්වරයා හමුවීම

இலங்கைக்கான இந்திய உயர் ஸ்தானிகர் கௌரவ. சந்தோஸ் ஜாவுடனான சந்திப்பு

Courtesy call by His Excellency Santosh Jha, High Commissioner of India for Sri Lanka.





"Voyage Sri Lanka 2024" සමුළුව කොළඹ කිංග්ස්බරි හෝටලයේදී

"Voyage Sri Lanka 2024" மாநாடு கொழும்பு ஹில்டன் ஹோட்டலில்

"Voyage Sri Lanka 2024" conference at the Kingsbury Hotel, Colombo





මහපොළ අරමුදල පිළිබඳ සාකච්ඡාව

மகாபொல நிதியம் பற்றிய கலந்துரையாடல்

Discussion on the Mahapola Fund

සහල් ආනයනකරුවන් සමඟ පැවති සාකච්ඡාව

அரிசி இறக்குமதியாளர்களுடனான கலந்துரையாடல்

Discussion with rice importers

ලංකාවේ කැනේඩියානු මහ කොමසාරිස්වරයා හමුවීම

இலங்கைக்கான கனடிய உயர் ஸ்தானிகர் கௌரவ. எரிக் வோல்ஸ் உடனான சந்திப்பு

Courtesy call by His Excellency Eric Walsh, High Commissioner of Canada for Sri Lanka.

ලංකාවේ යුරෝපා සංගමයේ තානාපතිනිය හමුවීම

இலங்கைக்கான ஐரோப்பிய ஒன்றிய ஸ்தானிகர் கௌரவ. கார்மன் மொரினோவுடனான சந்திப்பு

Courtesy call by Her Excellency Carmen Moreno, Ambassador of the European Union for Sri Lanka




ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස්වරයා හමුවීම

இலங்கைக்கான நியுசிலாந்து உயர் ஸ்தானிகர் கௌரவ. டேவிட் பைன் உடனான சந்திப்பு

Courtesy call by His Excellency Devid Pine, High Commissioner of New Zealand for Sri Lanka.




වෙළඳපොළේ පැවති සහල් හිඟය පිළිබඳව සහල් මෝල් හිමියන් සමග කළ සාකච්ඡාව

சந்தையில் நிலவும் அரிசித் தட்டுப்பாடு பற்றி அரிசி ஆலை உரிமையாளர்களுடன் கலந்துரையாடல்

Discussion with rice mill owners regarding the ongoing rice shortage in the market




ශ්‍රී ලංකාවේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපතිවරයා හමුවීම

இலங்கைக்கான ஐக்கிய அரபு எமிரேட்ஸ் உயர் ஸ்தானிகர் கௌரவ. கலெட் நாசர் உடனான சந்திப்பு

Courtesy call by His Excellency Khaled Nasser ALAmeri, Ambassador of the United Arab Emirates for Sri Lanka.





වසර ගණනාවක් වසා තිබූ හිඟුරක්ගොඩ සතොස විමෝල් ගබඩා සංකීර්ණය නිරීක්ෂණය

வருடக்கணக்காக மூடப்படிருந்த ஹிங்குராங்கொட சதொச அரிசி ஆலை மற்றும் களஞ்சியத் தொகுதியைப் பார்வையிடல்

Inspection of the abandoned Hingurakgoda Sathosa rice mill & the warehouse complex





මැදිරිගිරියේ ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානය නිරීක්ෂණය

மெதிரிகிரிய தானியக் களஞ்சிய மத்திய நிலையத்தைப் பார்வையிடல்

Inspection of the Medirigiriya Grain Storage Center





දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ශීතාගාරය නිරීක්‍ෂණය

தம்புள்ளை பொருளாதார மத்திய நிலைய குளிர்பதனக் களஞ்சிய வசதியை ஆய்வு செய்தல்

Inspection of the cold storage facility at the Dambulla Economic Centre

අමාත්‍යාංශයේ ආයතන ප්‍රධානීන් සමඟ පැවති සාකච්ඡාව

அமைச்சின் கீழுள்ள நிறுவனங்களின் தலைவர்களுனான கலந்துரையாடல்

Discussion with heads of institutions under the Ministry

ශ්‍රී ලංකාවේ ඉරාන තානාපතිවරයා හමුවීම

இலங்கைக்கான ஈரானியத் தூதுவருடனான சந்திப்பு

Courtesy call by His Excellency Dr.Alireza Delkhosh, Iranian Ambassador for Sri Lanka.

දේශීය ටින් මාළු නිෂ්පාදකයින් සමග කල සාකච්ඡාව

உள்நாட்டு ரின்மீன் உற்பத்தியாளர்களுடனான கலந்துரையாடல்

Discussion with local canned fish producers





අතහැර දමා තිබූ ගල්ගමුවේ වී ගබඩා සංකීර්ණය නිරීක්ෂණය

கைவிடப்பட்ட கல்கமுவ அரிசி ஆலை மற்றும் களஞ்சியத் தொகுதியை ஆய்வு செய்தல்

Inspection of the abandoned Galgamuwa rice mill & the warehouse complex





දේශීය ටයර් නිෂ්පාදකයින් සමග කළ සාකච්ඡාව

ரயர் உற்பத்தியாளர்களுடனான கலந்துரையாடல்

Discussion with local tire manufacturers





අතහැර දමා ඇති ඔයාමඩුව රජයේ වී ගබඩා නිරීක්ෂණය

கைவிடப்பட்ட ஓயமடுவ அரிசி ஆலை மற்றும் களஞ்சியத் தொகுதியை ஆய்வு செய்தல்

Inspection of the abandoned Oyamada Government rice mill & the Warehouse




පිඟන් සංස්ථාවට අයත් අතහැර දමා ඇති ඇලයාපත්තුව උළු කර්මාන්ත ශාලාව නිරීක්ෂණය

கைவிடப்பட்ட சிலோன் செரமிக்ஸ் கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான எலயாபத்துவ கூரை ஓட்டுத் தொழிற்சாலையைப் பார்வையிடல்

Inspection of the abandoned Elayapaththuwa roof tile factory owned by the Ceylon Ceramics Corporation




තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය නිරීක්ෂණ චාරිකාව

தம்புத்தேகம பொருளாதார மத்திய நிலையத்துக்கு விஜயம் செய்தல்

Visiting to the Thambuttegama Economic Centre




වසා දමා ඇති මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානය නිරීක්ෂණ චාරිකාව

கைவிடப்பட்ட மதவாச்சி பொருளாதார மத்திய நிலையத்துக்கு விஜயம் செய்தல்

Visiting to the abandoned Medawachchiya Economic Centre




2025 අයවැය යෝජනාවලිය පිළිබඳව අමාත්‍යාංශයට අදාළ ආයතන සමඟ කළ සාකච්ඡාව

2025 வரவுசெலவுத் திட்டப் பிரேரணை தொடர்பில் அமைச்சுக்குரிய நிறுவனங்களுடன் கலந்துரையாடல்

Discussion with relevant institutions of the Ministry regarding the 2025 Budget proposal




පාරිභෝගික සේවා අධිකාරියේ නිලධාරීන් සමග කළ සාකච්ඡාව

நுகர்வோர் விவகார அதிகாரசபை அலுவலர்களுடன் கலந்துரையாடல்

Discussion with officers of the Consumer Affairs Authority




සතොසට අයත් කොළඹ ඩී ආර් විජේවර්ධන මාවතේ ගොඩනැගිලි නිරීක්ෂණය

சதொசவிற்குச் சொந்தமான கொழும்பு டி.ஆர். விஜேவர்தன மாவத்தையிலுள்ள சொத்துகளை பார்வையிடல்

Inspection of properties on D.R.Wijewardena Mawatha,Colombo, owned by Sathosa

ශ්‍රී ලංකාවේ පාකිස්තාන මහ කොමසාරිස්වරයා හමුවීම

**இலங்கைக்கான பாகிஸ்தான் உயர் ஸ்தானிகருடனான சந்திப்பு**

Courtesy call by His Excellency Major General(Rtd) Faheem UI Aziz, Pakistan High Commissioner for Sri Lanka.

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය, අංක 492, ආර්.ඒ. ද මැල් මාවත , කොළඹ 03.
வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு, மற்றும்  கூட்டுறவு அபிவிருத்தி அமைச்சு, இல 492, ஆர்.ஏ. டி மெல் மாவத்தை, கொழும்பு 03.
Ministry of Trade, Commerce, Food Security and Co-operative Development, No 492, R.A. De  Mel Mawatha, Colombo 03.